# THE WHITE HACKLE

*Pioneer Sri Lanka Army Quarterly and the Journal of the Sri Lanka Light Infantry*

86
ISSUE
October - December
2015

# වයිට් හැකල්

ශ්‍රී ලංකා පාබල හමුදා සඟරාව
இலங்கை காலாட் படை சஞ்சிகை
JOURNAL OF THE SRI LANKA LIGHT INFANTRY

www.army.lk/lightinfantry Search...

editor.whitehackle@gmail.com






# සුභ මොහොතින් නව තනතුරට පත්වූ ඔබට
# රෙජිමේන්තු අධිපති ඇතුලු සියලුම නිලයින්ගේ උණුසුම් සුභ පැතුම්



මානි 1 හකාස
නි/62291 ලුතිතන් කර්නල්
ටීඑන්කේ පෙරේරා ශ්‍රීලපාහ



අණදෙන නිලධාරී 1 ශ්‍රීලපාහ
නි/63010 ලුතිතන් කර්නල්
ආර්ඒ සමරනායක පිඑස්සි ශ්‍රීලපාහ



අණදෙන නිලධාරී 6 ශ්‍රීලපාහ
නි/63036 ලුතිතන් කර්නල්
කේපීඑල් අමුණුපුරේ
ආර්ඩබ්ලිව්පී ශ්‍රීලපාහ



ක්‍රියාන්විත හා
පුහුණු භාර නිලධාරී 11 ශ්‍රීලපාහ
නි/64750 මේජර් ඩීඑන්
විධානපතිරණ ආර්එස්පි ශ්‍රීලපාහ



විධායක අධිකාරී 9 ශ්‍රීලපාහ
නි/6892 කපිතන්
එච්ආර්ඩී මංජුල ශ්‍රීලපාහ



විධායක අධිකාරී 11 ශ්‍රීලපාහ
නි/68890 කපිතන්
ආර්ඒඑම්එල් රණසිංහ ශ්‍රීලපාහ



විධායක අධිකාරී 1 ශ්‍රීලපාහ
නි/69031 ලුතිතන්
ආර්එම්ඒයු රණසිංහ ශ්‍රීලපාහ



උපකරණ පාලක නිලධාරි
9 (සෙව්) ශ්‍රීලපාහ
නි/33711 ලුතිතන් (උපා)
කේඩබ්පිඑස්එන් කරුණාදාස



රෙජිමේන්තු සැරයන් මේජර්
9(සෙව්) ශ්‍රීලපාහ සෙ/9ඩී00222
බනි I එම්ඩබ්ජීයු තිලකරත්න



සරඹ උපදේශක 11 ශ්‍රීලපාහ
සෙ/313674 වර්ණ සැරයන්
සුරිය කුමාර ඊඩබ්ලිව්යු



සරඹ උපදේශක 24 ශ්‍රීලපාහ
සෙ/314858 ව/සැරයන් සිරිවර්ධන එච්බී



ප්‍රධාන ලිපිකරු 11 ශ්‍රීලපාහ
සෙ/315935 සැරයන්
බංඩාර ජේආර්ඩීපී

JOURNAL OF THE SRI LANKA LIGHT INFANTRY

The WHITE HACKLE 86 ISSUE OCT - DEC

ශ්‍රී ලංකා පාබල හමුදා සඟරාව | වයිට් හැකල්

# වයිට් හැකල් White Hackle

*Pioneer Sri Lanka Army Quarterly and the Journal of the Sri Lanka Light Infantry*


| පටුන | පිටුව |
|---|---|
| අදහස් උදහස් හා විවේචන | 02 |
| 24 ශ්‍රීලපාහ පුවත් | 03 |
| 6 ශ්‍රීලපාහ පුවත් | 04 |
| විශිෂ්ඨ සේවා විභූෂණයට ප්‍රණාමය පුද කිරීම | 05 |
| 26 වන සංවත්සරය සැමරූ රෙම ශ්‍රීලපාහ | 06 |
| 9 ශ්‍රීලපාහ පුවත් | 07 |
| 10 ශ්‍රීලපාහ පුවත් | 08 |
| 26 ශ්‍රීලපාහ පුවත් | 09 |
| 20 ශ්‍රීලපාහ පුවත් | 10 |
| 8 ශ්‍රීලපාහ පුවත් | 11 |
| සේවා වනිතා විත්ති | 12 - 13 |
| 1 ශ්‍රීලපාහ පුවත් | 14 |
| 11 ශ්‍රීලපාහ පුවත් | 15 |
| සෙබල සිතක සිතිවිලි | 16 |
| 23 ශ්‍රීලපාහ පුවත් | 17 |
| 25 ශ්‍රීලපාහ පුවත් | 18 |
| 7 ශ්‍රීලපාහ පුවත් | 19 |
| පාබල මේලා වෙළඳ ප්‍රදර්ශනය හා සැණකෙළිය 2015 | 20 - 21 |
| කකුලේ ඇඟිලිකරු වණවීමට ප්‍රතිකාර | 22 |
| බීමත්ව සිටිය දී සිදුකරන වැරදි හා ලබාදෙන දඬුවම් | 23 |
| රෙම ශ්‍රීලපාහ විහාරස්ථානය විවෘත කිරීම | 24 |
| සත්ව ලෝකයෙන් බිඳක් | 25 |
| 12 ශ්‍රීලපාහ පුවත් | 26 |
| 15 ශ්‍රීලපාහ පුවත් | 27 |
| උපන්දින සුභපැතුම් | 28 |
| දසුනේ හසුන | 29 |
| පාබල සංගමය | 30 - 31 |
| මැසික වැටුප කළමණාකරන කරන හැටි | 32 - 33 |
| 19 ශ්‍රීලපාහ පුවත් | 34 |
| නිලධාරී නිවසනය විවෘත කිරීම | 35 |
| අභයදානය දීමේ ආනිශංස | 36 - 37 |
| Nelson Mandela | 38 |
| ප්‍රහේලිකාව | 39 - 40 |














## කවරයේකථාව




තෙවන වරටත් ශ්‍රී ලංකා පාබල හමුදාව මගින් සංවිධානය කරන ලද පාබල මේලා 2015 වෙළඳ ප්‍රදර්ශනය හා සැණකෙළිය අති උත්කර්ෂවත් අයුරින් 2015.12.18 දින හික්කඩුව මහජන ක්‍රීඩාංගනයේදී ආරම්භ වූ අතර, පොල්තෙල් පහන ආලෝකමත් කරමින් රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරල් කේවීඩීඩී කරුණාසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ඩබ්ලිව්වී එන්ඩීයූ පීඑස්සී තුමන් සුරතින් සැණකෙළිය විවෘත කරන ලද අවස්ථාව රැගත් ඡායාරූපයක් සමගින් මෙවර කලාපයේ මුල් පිටුව වර්ණවත් වී ඇත.

**Printed by**

වයිට් හැකල් මුද්‍රණාලය

Sri Lanka Light Infantry
Army Cantonment
Panagoda, Homagama.

T:P: - 0112098133
Ext - 57660
Fax - 0112855204
E-mail - whitehacklesLli@gmail.com

# SRI LANKA LIGHT INFANTRY QUARTERLY

**THE WHITE HACKLE** 86th Issue - Oct-Dec 2015




**COLONEL OF THE REGIMENT**
Maj Gen KADA Karunasekara RSP VSV USP ndu psc



**CENTRE COMMANDANT**
Brig MM Kithsiri RSP



**DEPUTY CENTRE COMMANDANT**
Col GMN Perera RWP RSP



**ADJUTANT RHQ SLLI**
Maj KY Priyadarshana RSP psc SLLI

## අදහස්, උදහස් හා විවේචන
## Readers Please Write in

The **WHITE HACKLE** the Voice of Sri Lanka Light Infantry Regiment is now firmly established. It has reached maturity. This is the 86th issue. This quarterly is for members of the SLLI, their families, Ex-Servicemen of SLLI, and as a whole for the entire Army. It will be extended even to all Sri Lankans.

We should not rest on our laurels. Targets have to be set. Greater goals to be achieved. The success of **WHITE HACKLE** depends on combined efforts. Everyone has his contribution to make, and every contribution is most welcome in any language (Sinhalese, Tamil and English). What is valued is our making the attempt, and then we can surely do our bit. Express your thoughts, ideas, opinions, and criticisms, hopes and fears through **" THE WHITE HACKLE "**, the journal of the oldest and proudest Regiment of them all. If you have much to say about your Battalion's experience, go ahead and write in to **" THE WHITE HACKLE "** we are willing to accept and publish. We are happy to hear you and consider your contribution in any form; sketches, cartoons, stories, poems and whatever comes from your thoughts and your pen.

Our Motto is **" Ich Dien", " I Serve"**. Let **'White Hackle'** be a way to serve each other, our Regiment and our country with our banner flying high as it always will. Wishing you all the very best.

-Editor-


## EDITORS

**CHIEF CONSULTANT**
Maj Gen KADA Karunasekara RSP VSV USP ndu psc

**EDITOR IN CHIEF**
Brig MM Kithsiri RSP

**ASSISTANT EDITORS**
**( Adjutant RHQ SLLI )**
Maj KY Priyadarshana RSP psc SLLI
**(Officer In Charge )**
Maj AD Gunarathne RSP SLLI
**(Press Officer In Charge)**
Maj TMAN Thennakoon RWP SLLI

**HONOURARY CONSULTANTS**
Gen RMD Rathnayake (Rtd) WWV RWP RSP V SV USP ndu psc
Lt Gen HV Atukorale (Rtd) VSV psc FBIM
Brig AER Abeyesinghe (Rtd) KSV

**COMPUTER TYPE SETTING & DESIGNED**
L/Cpl Suranga RBP - White Hackle Publication (25 SLLI)


## කතුවැකිය

තත්පරයෙන් තත්පරය ගත වෙන කාලය පසුව දින සති මාස අවුරුදු වලට පෙරලෙන්නාසේම කාලය ආපසු ගත නොහැකි බවද සත්‍යයකි. එසේනම් ගෙවෙන හැම නිමේෂයකින්ම උපරිම ඵල නෙලා ගැනිම තරම් තවත් අගනා දෙයක් නොමැති බවද සිතට ගත යුතුය. ගතවු එසේත් නැතිනම් ගෙවී ගිය කාලය ගැන පසුතැවිද පලක් නොමැති වු කල්හි වර්තමානයේදී අනාගතය ගැන සිතා රන් මෙන් වටිනා කාලයෙන් වැඩක් ගැනිමට ක්‍රියාකල යුතු නොවේද. මොහොතක් ගත වු වර්ෂයේ අප කාලය ගෙවා දැමු අයුරු නැවත වරක් ආවර්ජනය කර බලමු. සමහරුන්ට වර්ෂය ගෙවි ගිය අයුරු මතකයක් තිබීමටද නුපුළුවන. අප කල කී දේ වර්ග දෙකකි. එනම් හොද හා නරක පමනි. බුදු දහමට අනුව අප අවසානයේදී රැගෙන යන්නේද හොද නරක පමනක්ය. අප ගෙවි ගිය වසරේදි කල හොද නරක නැවත ස්මරනය කර ලබන වර්ෂයේදි තවත් හොද දේ ජීවිතයට එක් කිරිමට හැකි පසුබිමක් සකස් කර ගැනීමට උත්සහ කරමු. මිල මුදල පමනක් වැඩියෙන් එක්රැස් කර ගත් විට මිනිසුන් සම්පුර්ණ නොවේ. භෞතික හා අධ්‍යාත්මික වශයෙන් පිරිපුන්ව නව වර්ෂයට මුහුණ දිමට සුදානම් වෙමු. අළුතින් සිතන්නට පතන්නට වර්ෂයක් අපට ඇත. මනුස්ෂත්වය පෙරටු කර ගත් වර්ෂයකදී සැමට ගරු කරන මානව හිතවදී මිනිසෙකු ලෙස සිතන්නට පුරුදු වෙමු. ගෙවී ගිය වර්ෂයේදී එකතු කර ගත් හොද තුලින් ලබන වර්ෂය ගොඩ නගන්නට උත්සහ කරමු. වයිට් හැකල් පාඨකයින් සැමට ලබන වර්ෂය සුභ නව වසරක්ම වේවායි ප්‍රාර්ථනය කරන අතර, වසරක් පුරණ සගරාවේ ගුන දොස් දකිමින් දිරි ගැන්වු සැමට තුති පුදන්නටද මෙය අවස්ථාවක් කර ගනිමු.


**Publisher**

**REGIMENTAL CENTRE SRI LANKA LIGHT INFANTRY**
**Telephone**- 0112855204 / 0112855357 - 59 **Ext**-57656 **Fax**- 0112855204
**E-mail**-editor.whitehackle@gmail.com editor / whitehackle@yahoo.com **Website**- www.army/lightinfantry.lk

# 24ට දැන් අවුරුදු 6යි





2015.09.25 දින සය වසරක් සම්පූර්ණ කළ 24 ශ්‍රීලපාහ බළඇණි සංවත්සරයට සමගාමීව 2015.09.21 දින ඒකක/කණ්ඩායම් ධජයන්ට සෙත්පැතීම ක්‍රියාන්විත හා පුහුණු භාර නිලධාරි මේජර් එච්ඒවීසිපේ හපුආරච්චි ආර්ඩබ්පි ශ්‍රීලපාහගේ ප්‍රධානත්වයෙන් අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ අභියස සිදු කෙරිණ.

2015.09.25 දින ස්වාමින් වහන්සේලා 10 නමක් බළඇණි මූලස්ථානය වෙත වැඩම කරවා පිරිත් සජ්ඣායනාවක් හා දහවල් සාංඝික දාණය පිළිගන්වන ලදී. 2009.09.26 දින ඒකකයේ අධිරිද්ම සංගීත කණ්ඩායමේ සුමියුරු ගී නදට එක් වෙමින් විශේෂ ආහාර වට්ටෝරුවකට අනුව සකසා තිබූ දිවා භෝජන සංග්‍රහයට සියලුම නිලයින් සහභාගී විය.







# නව නිපැයුම්



නිපැයුම්කරු :
සෙ/325166 ලාකෝ
අජිත් කුමාර ටීඒ

ආසේමු වන්නි බළප්‍රදේශයේ ස්ථානගත බළඇණි අතර, නව නිපැයුම්/නව සොයාගැනීම් ප්‍රදර්ශණයක් පැවැත්වීමට කටයුතු කරන ලදී. එහිදී මෙම ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එස්එන්එම්ඒබී අරම්භේපොල ශ්‍රීලපාහ ගේ සහ විධායක අධිකාරී කපිතන් ඩීඑම්ඩීසී දිසානායක ශ්‍රීලපාහ ගේ මගපෙන්වීම යටතේ සෙ/325166 ලාකෝ අජිත් කුමාර ටීඒ යන කොනොනි විසින් අඩු පිරිවැයක් යටතේ වැඩි කාර්‍යක්ෂමතාවයකින් යුත් තණකොළ කපන යන්ත්‍රයක් නිර්මාණය කරන ලදී.

## ක්‍රීඩාවෙන් ඉදිරියට එන

# සංජීව



ශ්‍රීලපාහ පාපැදි ක්‍රීඩා සංචිතයට ක්‍රිඩකයින් තොරාගැනීමේ අරමුනින් 2015.08.25 දින මුලතිව් හි පැවැති අන්තර් ඒකක ආධුණික පාපැදි තරගාවලියට සහභාගී වි ක්‍රීඩකයින් 38 දෙනෙකු අතුරින් 05 වන ස්ථානය ලබාගත් සෙ/332005 සාසෙ සංජීව කුමාර එන්එම් ශ්‍රීලපාහ පාපැදි සංචිතයට ඇතුලත් වීමට දක්ෂතා පෙන්වා ඇත. ඔබට එම ක්‍රීඩා ඉසව්වෙන් ඉහළට යාමට අණදෙන නිලධාරී තුමන් ප්‍රමුඛ ඒකකයේ සියලුම නිලයින් මෙසේ සුභාශිංසන ගෙන එන්නෙමු.

6 ශ්‍රීලපාහ




# 25 වසරක රජත ජයන්තිය සමරයි

බළඇණියට වසර 25 ක් සපිරෙන රජත ජයන්තිය සමරමින් මිහින්තලය මහකනදරාව කඳවුරේදි ආගමික වතාවත් වලට මුල්තැන දෙමින් අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් කේඒ පුෂ්ප කුමාර ආර්ඩබ්ලිව්පි ආර්එස්පි පීඑස්සී ශ්‍රීලපාහ වෙත කදවුරු මුරයක් ලබාදෙන ලදි. එතුමාගේ සංකල්පයක් මත ගොඩනැගු ඒකක සරඹ භූමියේදි ප්‍රථම සම්මාණ පෙළපාලියක් පිරිනැමු අතර, ඉන් පසු අණදෙන නලධාරී තුමා විසින් සියලු නිලයින් අමතන ලදි.

අණදෙන නිලධාරී තුමාගේ මුලිකත්වය මත සියළු නිලයින්ගේ ශ්‍රම දායකත්වයෙන් ඉදිවු පාලන,ආධාරක සහ සි කණ්ඩායම් හී භඨනිවාස අණදෙන නිලධාරී තුමා විසින් විවෘත කරන ලදි. අනතුරුව ආසේමු (ව) අධි රිද්ම සංගීත කණ්ඩායමේ සත්සර නාද රටාවන්ට අනුව සියළු නිලයින්ගේ සුහද හමුව සියළු නිලයින්ගේ මනසට නැවුම් බවක් එකතු කරන ලදි. අවසානයේ දිවා කාලයේදි සියළු නිලයින්ගේ සහභාගිත්වයෙන් දිවා භෝජන සංග්‍රහයක් ද පවත්වා උත්සව කටයුතු නිමාවට පත් කෙරුණු අතර, ඒකකය මෙතුවක් පැමිණි විජයග්‍රාහි මග ඔස්සේම 26 වන බළඇණි දිනය දක්වා පියමන් කරන්නට අණදෙන නිලධාරී තුමන් ඇතුළු සියළු නිලධාරීන්ටත් රෙසැමේ ඇතුළු සියළු සෙසු නිලයින්ටත් අවශ්‍ය ශක්තිය හා ධෛර්ය නිරන්තරයෙන්ම අත්පත් වේවායි ප්‍රාර්ථනා කරමු.







# රණවිරු අනුස්මරණ පිංකම

ඒකකයට අයත් විරෝධාර රණවිරුවන් 464 ක් වෙනුවෙන් 6ශ්‍රීලපාහ රණවිරු සංගමය වාර්ෂිකව සංවිධානය කරනු ලබන පිංකම් මාලාව 16 වෙනි වරටත් අණදෙන නිලධාරී තුමන් ඇතළු සියළුම නිලයින් ගේ සහභාගීත්වයෙන් 2015.07.11 සහ 12 යන දෙදින තුල මිහින්තලය මහකනදරාව 6 ශ්‍රීලපාහ මුලස්ථානයේදි පැවැත්විය.2015.06.11දින මහ කනදරාව ප්‍රදේශයේ සිංහල සංස්කෘතික අංග රැසකින් සමන්විත අලංකාර පෙරහැරකින් රණවිරු ඥාතීන් සහ ප්‍රදේශවාසීන් බෝගහයාය විහාරස්ථානයේ සිට සධාතුක කරඩුව රණවිරු අනුස්මරණ ශාලාව වෙත වැඩම කරවන ලදි. රණවිරු සංසදයේ ගරු ලේකම් ඒඒ ප්‍රේමරත්න මහතා විසින් පිරිත් මණ්ඩපය තුල කරඩුව තැන්පත් කරන ලදි.



මියගිය රණවිරුවන්ට පිංපතමින් ආබාධිත රණවිරුවන්ට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරමින් සමස්ථ යුද්ධ හමුදාවටත් ලක්වාසී ජනතාවටත් සෙත්පතා පසුදින පහන් වනතුරු පිරිත් සජ්ජායනාව පවත්වා 2015.07.12 දින උදෑසන කදවුරු භූමිය කසාවතින් සරසමින් ගරු සංඝයා වහන්සේලා සිය නමක් කදවුරට වඩම්මවා හීල් දානය පිලිගන්වා පිංකම් මාලාව නිමාවට පත් කරන ලදී.

ප්‍ර ශාඛාව 6 ශ්‍රීලපාහ
ඡායාරූ : කෝප්‍රල් මහින්දසේන ඒපීඑම්ආර්
(වයිට්හැකල් ඡායාරූප අංශය)

# ඔබ ලැබූ විශිෂ්ඨ සේවා විභූෂණයට අපගේ ගෞරවනීය ප්‍රණාමය



මේ පුංචි අපේ ශ්‍රී ලංකාවේ අරක්‍ෂාව වෙනුවෙන් සුවිශේෂී සහ විශිෂ්ඨ මෙහෙවරක් ඉටු කළ මේජර් ජෙනරාල් කේවීඩීඒ කරුණාසේකර වෙත විශිෂ්ඨ සේවා විභූෂණ පදක්කමක් පිරිණැම්ම අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ සුරතින් ජනාධිපති කාර්යාලයේ දී 2015.10.08 වන දින පෙරවරුවේ සිදු කෙරිණි. මේජර් ජෙනරාල් තුමණි,

ත්‍රිවිධ හමුදාවල දැනට සේවයේ යෙදී සිටින සහ විශ්‍රාමික නිලධාරින් තිස් දෙදෙනෙක් මෙහිදි ජනාධිපති තුමන් අතින් විශිෂ්ඨ සේවා විභූෂණ පදක්කම හිමි කර ගත්තේය.

මේජර් ජෙනරාල් තුමණි,

විශිෂ්ඨ සේවා විභූෂණ පදක්කමෙන් සම්මාන ලැබූ ඔබතුමන් ට අපගේ පාසල වන ර/සීවලී මධ්‍ය විද්‍යාලයේ ගරු විදුහල්පති තුමාගේත් ගරු ආචාර්ය මණ්ඩලයෙත් දැනට මා අධ්‍යාපන කටයුතු කරගෙන යන ර/සීවලී මධ්‍ය විද්‍යාලයේ සියලුම අයියලා සහ අක්කලාගේ ද නංගිලා සහ මල්ලිලාගේ ද මාගේ ද ගෞරවණීය ප්‍රණාමය පුදකර සිටින්නේමු.

මේජර් ජෙනරාල් තුමිණි,

මා මෙසේ ලිවීමට අදහස් කලේ ඔබ තුමන්ට ගෞරවයක් වන පිණිසයි. විශිෂ්ඨ සේවා විභූෂණ පදක්කම සුවිශේෂී ප්‍රදානයක් වන අතර, එය යුධ හමුදාවේ වසර 25 ක අඛණ්ඩ සේවා කාලයක් සහ විශිෂ්ඨ සේවා ඉතිහාසයක් ඇති නිලධාරීන්ට පමණක් ප්‍රදානය කරනු ලැබේ. අතිගරු ජනාධිපති තුමාගේ සුරතින් විශිෂ්ඨ සේවා විභූෂණ පදක්කමක් ලබා ගැනීම ගැන අපගේ ගෞරවණීය ප්‍රණාමය නැවත නැවතත් පුදකර සිටින්නෙමු.

මේජර් ජෙනරාල් තුමාට තෙරුවන් සරණ හා සියලුම දෙවිවරුන්ගේ පිහිට ආරක්‍ෂාව නිරන්තරයෙන්ම හිමි වේවායි කියා ප්‍රාර්ථනා කර සිටින්නේ,

**ආර්එම් ලහිරු සම්පත් බණ්ඩාර**
**10 ඒ ශ්‍රේණිය ර/සීවලී මධ්‍ය විද්‍යාලය**














## 26 වන සංවත්සරය අභිමානයෙන් සමරන ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුව

1989 ජුනි 30 දිනැති විශේෂ හමුදා චර්යා නියෝග මගින් මෙම රෙජිමේන්තු මධ්‍යස්ථානය ස්ථාපනය කිරීම සදහා නියෝග නිකුත් කරන ලදී. එම නියෝගය අනුව මෙම රෙජිමේන්තු මධ්‍යස්ථානය 1989 ඔක්තෝබර් මස 23 වන දින පනාගොඩ යුධ හමුදා ජනපදයේ රෙජිමේන්තු ධජය ඔසවා ආරම්භ කරන ලදී.

එදින සිට මේ දක්වා අඛණ්ඩව වසර 26ක් අභිමානයෙන් සමරනු ලබන මෙම සංවත්සරය මෙම වර්ෂයේ ද 2015 ඔක්තෝබර් මස 23 දින ආගමික වතාවත් වලට මුල්තැන දෙමින් රාත්‍රියේදී සර්වඥ ධාතු කරඬුව පෙරටු කරගත් මහා සංඝරත්නය සමගින් අලංකාර පෙරහැරකින් පාබල හමුදා රෙජිමේන්තු පරිශ්‍රය තුලට වැඩම කරවන ලදී. මූලික ආගමික වතාවත් සිදු කර වර්ණ ධජයන් වලට හා රෙජිමේන්තු මංගල හස්ථියා කණ්ඩුල වෙත පිරිත් නූල් බැඳ ආශීර්වාදය ලබාගනිමින් යුද්ධයේදී ප්‍රාණදානය දුන් සියලුම රණවිරුවන් වෙත නිවන් සුවය ද, ආබාධිත තත්වයට පත් රණවිරුවනට ඉක්මන් සුවයද ප්‍රාර්ථනා කරමින් එදින රැය පහන් වනතුරු පිරිත් සජ්ජායනාවක් සිදු කර පසු දින මහා සංඝරත්නය විෂයෙහි හීල් දානය හා පිරිකර පූජා කරමින් සංවත්සරයෙහි සමාප්තිය සනිටුහන් කරන ලදී

මෙම සංවත්සරය රෙජිමේන්තු අධිපති තුමන් ප්‍රධානව සිදු කරන ලද අතර, මධ්‍යස්ථාන සේනාවිධායක තුමන් ප්‍රමුඛ රෙජිමේන්තුවේ සියලුම නිලයින් මේ සඳහා සහභාගී වූහ.

සටහන : වයිට්හැකල් ප්‍රකාශන අංශය
ඡායාරූ : කෝප්‍රල් මහින්දසේන ඒපීඑම්ආර්
(වයිට්හැකල් ඡායාරූප අංශය)

JOURNAL OF THE SRI LANKA LIGHT INFANTRY
The WHITE HACKLE 86 ISSUE OCT - DEC
ශ්‍රී ලංකා පාබල හමුදා සඟරාව
இலங்கை காலாட் படை சஞ்சிகை | වයිට් හැකල්

# 22 වන බළඇණි දින

# මහා කප්රුක් පූජා පිංකම



ඒකකය ආරම්භ කර 2015.11.01 වන දිනට වසර 22 ක් සම්පූර්ණ වීම නිමිත්තෙන් දේශයට නියත සාමයක් උදාකරලීමේ උදාරතර මෙහෙයට උරදී මව්බිම වෙනුවෙන් තම ජීවිතය පූජා කළ රණවිරුවන් හට හා එම පවුල් වල ඥාතීන්ටද, එම මෙහෙවරට උරදී දැනට ඒකකයේ රාජකාරියේ නියුතු ඒකකයේ අණදෙන නිලධාරීතුමන් ප්‍රමුඛ සියලුම නිලයින්ටත් ඔවුන්ගේ පවුල් වල සියලුම සාමාජිකයින්ටත් ඒකකයේ සේවයේ නියුතු සිවිල් සේවක මහතුන් හා ඔවුගේ පවුල්වල සාමාජිකයින්ටත් සෙත් පතා අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් පීඒබීඑම්පී විජේගුණවර්ධන ආර්එස්පී ශ්‍රීලපාහගේ අධීක්ෂණය යටතේ ඒකකයේ නියුතු සියලුම නිලයින්ගේ හා සිවිල් සේවක මහතුන්ගේ පවුල්වල ඥාතීන් ද සහභාගී කරගනිමින් අනුරාධපුර ජය ශ්‍රී මහ බෝධිරාජාණන් වහන්සේ අභියස 2015.10.15 වන දින බෝධිපූජා පිංකමක් පවත්වා 2015.10.16 වන දින ස්වර්ණමාලි මහා චෛත්‍ය රාජයාණන් වහන්සේ වෙත කප්රුක් පුජා පිංකමක් සිදුකරන ලදී. බුදුරජාණන් වහන්සේගේ සර්වඥ ධාතුන් නිදන් කොට ඇති මෙම ස්වර්ණමාලි මහ චෛත්‍ය රාජයාණන් වෙත කප්රුක් පුජා කිරීම තුලින් මෛත්‍රී බුදුරාජාණන් වහන්සේගේ බුදු සසුනේ දහම් අසා රහත් භාවයට පත්වීමට අවස්ථාව සැලසීම, පුද්ගලයෙකු නායකත්වයට පත්ව පිරිස් මෙහෙය වීමේ හැකියාව වර්ධනය වීම, ලෙඩ දුක් වලින් තොරව නිරෝගී ජීවිතයක් ගත කිරීමට හැකියාව ලැබීම, ආදී මහත් ආනිශංස ලැබ දෙන පිංකමකි.

එවැනි උතුම් කුසළකර්මයක් සිදුකිරීමට ඒකකයේ සෙබලුන් මෙහෙයවූ අණදෙන නිලධාරි තුමන් ප්‍රමුඛ එකී කාර්යය නිම කිරීමට උරදුන් සියලුම නිලයින්ට ප්‍රණාමය පුදකිරීමට මෙය අවස්ථාවක් කරගන්නෙමු.

**සැකසුම : සැරයන් ඉද්දමල්ගොඩ අයිඩීඒකේ මුලස්ථානය 9(සෙව්) ශ්‍රීලපාහ**

## නව කොනොනි සමාජ ශාලාවක්



ඒකකයේ සියලුම කොනොනීන්ගේ ද්‍රව්‍යමය ආධාර සහ ශ්‍රම දායකත්වයෙන් අභිනවයෙන් ඉදිකරනු ලැබූ නව කොනොනි සමාජ ශාලාව 2015 ක්වූ ඔක්තෝබර් 20 වන දින අණදෙන නිලධාරි තුමන් සමගින් 62 සේනාංකාධිපති බ්‍රිගේඩියර් කේපීඩී පෙරේරා ආර්ඩබ්පී ආර්එස්පී යුඑස්පී පීඑස්සී අයිජී විසින් සුභ මොහොතින් විවෘත කරන ලදි.

## 22 වන බළඇණි දින සමරයි

22 වල බළඇණි දින අණදෙන නිලධාරි තුමන් වෙත මුර පිරික්සුමක් සහ සම්මාන පෙළපාලියක්ද ලබාදෙන ලදි. ඒකකයේ 22 වන සංවත්සරය සනිටුහන් කරමින් අණදෙන නිලධාරි තුමා කදවුරු භූමියේ අඹ පැලයක් රෝපනය කිරීමෙන් පසු සියලුම නිලයින් සමගින් තේ පැන් සංග්‍රහයකට හා දිවා භෝජන සංග්‍රහයකට සහභාගී විය.







# නව 65 සේනාංකාධිපති තුමන් හට 10 ශ්‍රීලපාහ බුහුමන්....



65 සේනාංකාධිපති වශයෙන් බ්‍රිගේඩියර් ඩබ්ලිව්ඩීඑස් විරවර්ධන ආර්එස්පි යුඑස්පි අයිපි යන ජ්‍යේෂ්ඨ නිලධාරී තුමා 2015.09.17 දින වැඩ භාරගත් අතර, එම අවස්ථාවේදි මෙම ඒකක භඨ පිරිස් විසින් සම්මාන මුරයකින් පිළිගත් අතර, නව සේනාංකාධිපති තුමා හට අණදෙන නිලධාරි මේජර් ටීකේඩී ධර්මසේන ආර්එස්පි ශ්‍රීලපාහ විසින් නිලධාරීන් 03හා සෙසුනිලයින් 48 කින් සමන්විත භඨ පිරිසක් විසින් ඉතාමත් උත්කර්ශවත් අන්දමින් සම්මාන පෙළපාලියක් ද පිරිණාමන ලදි.

බුද්ධි අංශය
10 ශ්‍රීලපාහ





## 6 DAY WAR සයදින යුද්ධය Presentation

ඒකක අණදෙන නිලධාරි මේජර් ටීකේඩී ධර්මසේන ආර්එස්පි ශ්‍රීලපාහ විසින් 2015.09.10 දින ආරක්ෂක සේනා මුලස්ථානය කිලිනොච්චි දේශණ ශාලාවේදි සයදින යුද්ධය තේමාවෙන් ඉදිරිපත් කිරීමක් (PRESENTATION) කිළිනොච්චි ආඥාපති මේජර් ජෙනරාල් එස් රණසිංහ ආර්ඩබ්ලිව්පි ආර්එස්පි එන්ඩියු පිඑස්සි යන ජ්‍යේෂ්ඨ නිලධාරි තුමා හට ඉදිරිපත් කරන ලදි.








# පස්වන සංවත්සරය සමරමින් පෙරට

26 වන බලඇණියට වසර 05ක් සපිරෙන 2015.09.20 දිනට සමගාමීව වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක වූ අතර, එහිදී ආගමික කටයුතු වලට මුල්තැන දෙමින් අනුරාධපුර ජය සිරිමහ බෝ සමිඳු අභියස කිරි ආහාර පූජාවක් හා මඩු දේවස්ථානයේ පූජාවක් සිදුකරමින් ඒකක ධජයන්ට සෙත් පැතීය. මීට අමතරව නවතමයෙන් ඉදිවූ මුර හල හා කායවර්ධන මධ්‍යස්ථානය විවෘත කල අතර, මැදවච්චිය ඉසෙන් බැස්සගල විහාරස්ථානයේ ස්වාමීන් වහන්සේලා පස් නමක් වැඩහිඳුවා බෝධි පූජා පිංකමක් පැවැත්වීය







# නව නිපැයුම්

*"අලුත් අලුත් දැ නොතකන ජාතිය ලොව නොනගී"*
(කුමාරතුංග මුනිදාසයන්)

ආසේමු වන්නි වෙතින් සංවිධානය කරන ලද 2015 වර්ෂයේ නව නිපැයුම් තරඟාවලිය නොවැම්බර් 22 සිට 24 දින දක්වා පවත්වන ලදි. මෙම බල ප්‍රදේශයේ ස්ථාපිත සියලුම බළඇණි මේ සඳහා ඉදිරිපත් කිරීම් කල අතර, එයට සමගාමීව මෙම ඒකකය වෙතින්ද නව නිපැයුමක් ඉදිරිපත් කරන ලදී. මේ අනුව ලුතිනන් එම්කේජේයූඑම් ගුණරත්න ශ්‍රීලපාභගේ අදහසක් මත විදුලි බල්බ ගැලවීමේ සහ සවි කිරීමේ උපකරණයක් නිර්මාණය කර ඉදිරිපත් කළ අතර, එම නිර්මාණයට තරඟාවලියේ දෙවන ස්ථානය හිමිවිය.



20 ශ්‍රීලපාහ

# 20ට පුස්තකාලයක්



20 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව වෙත ඉමහත් අඩුපාඩුවක්ව පැවති පුස්තකාලය සහ ද: කා: හා: නිලධාරී කාර්යාලය සියලුම නිලයින්ගේ ශ්‍රම දායකත්වයෙන් වැඩ නිම කර 2015 ක් වූ සැප්තැම්බර් මස 24 දිනට යෙදුන සුභ මොහොතින් අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් අයිපී ජයසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ ගේ සුරතින් විවෘත කරන ලදි.

"කියවීම මිනිසා සම්පූර්ණ කරයි",යන වදන පෙරදැරිව මෙම පුස්තකාලය ඒකකයේ සියලුම සාමාජිකයින්ගේ දැණුම වර්ධනයට ඉමහත් අත්වැලක් වෙමින් අණදෙන නිලධාරී තුමන්ගේ සංකල්පය මල්ඵල ගැන්වීය. ආරක්ෂක සේනා මුලස්ථානය (කිළි) ආරක්ෂක බලප්‍රදේශය යටතේ පාලනය වන මෙම ඒකකය අණදෙන නිලධාරී තුමන්ගේ නිවැරදි නායකත්වය නිසාවෙන්ම හොදම බළඇණිය බවට පත්වීමට හැකිවීම පාබල හමුදා රෙජිමේන්තුවට මහත් ආඩම්බරයක් බව කිව යුතුය.



# CO' PRESENTATION

## අණදෙන නිලධාරීන්ගේ ඉදිරිපත් කිරීම්




ආසේමු (කිළි) බළප්‍රදේශයේ ස්ථාපිත සියලු බළඇණියන්හී නිලධාරින්ගේ ඉංග්‍රිසි මෙන්ම සාමාන්‍ය දැණුම සහ කුසලතාවයන් වර්ධනය කිරීම වස් අණදෙන නිලධාරී ඉදිරිපත් කිරීම (CO' PRESENTATION) නම් වූ ශ්‍රව්‍ය දෘශ්‍ය ඉදිරිපත් කිරීම් මාලාව ආරම්භ කරමින් වර්ෂ 2015 ක් වූ අගෝස්තු මස 20 වන දින 66 සේනාංකාධිපති මේජර් ජෙනරල් ඒපී ද ඉසෙඩ් වික්‍රමරත්න ආර්ඩබ්ලිව්පී එන්ඩීයූ පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන්ගේ ප්‍රධානත්වයෙන් NUCLEARIZATION OF SOUTH ASIA යන තේමාවෙන් ඒකකයේ කොනොනි සමාජ ශාලාවේ ඉතා සාර්ථක ලෙස සිදු කරන ලදි.

මේ සදහා අණදෙන නිලධාරීතුමන් සමගින් කපිතන් පිපිඑන් පුංචිහේවා ශ්‍රීලපාහ හා ලුතිතන් බීඒජීඩීඒ බමුණුආරච්චි ශ්‍රීලපාහ යන නිලධාරීන් කථිකයින් වශයෙන්ද, විධායක අධිකාරී ලුතිතන් ආර්එම්ආර්එම් රාජකරුණා ශ්‍රීලපාහ යන නිලධාරී ඉදිරිපත් කිරීම ක්‍රියා කරවන්නා ලෙස ද, කටයුතු කරන ලදි. මෙම ඉදිරිපත් කිරීමේ අන්තර්ගතය වූයේ දකුණු ආසියාවේ න්‍යෂ්ඨිකරණය සහ ශ්‍රී ලංකාවට එහි ඇති යහපත් හා අයහපත් ප්‍රතිපලයන් යන්නයි.

බුද්ධි අංශය 20 ශ්‍රීලපාහ

# ආසේමු (බටහිර)ආඥාපති තුමාගේ සංචාරය

2015 නොවැම්බර් මස 17 වන දින ආසේමු (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් එස් රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයු පිඑස්සී ඒකකයේ නිරීක්ෂණ චාරිකාවක් සඳහා පැමිණෙන ලදි.

මෙහිදි ආඥාපති තුමන් පිළිගැනිම සඳහා සම්මාන මුරයක් පිරිනමනු ලැබූ අතර, පසුව අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එල්එච්සීආර් සිරිවර්ධන ආර්එස්පී ශ්‍රීලපාහ විසින් බළඇණිය වෙතින් සිදුකරනු ලබන රාජකාරීන් සැබැදිව සවිස්තරාත්මකව එතුමන් දැනුවත් කරන ලදි. අනතුරුව නිලධාරි නිවස්නයේ සූදානම් කර තිබූ තේ පැන් සංග්‍රහයට සහභාගි වූ එතුමන් ඒකක සමරු සටහන් පොතෙහිද සටහන් තබන ලදි. මෙම බළඇණි නිරීක්ෂණ චාරිකාව සිහිවීම පිණිස අණදෙන නිලධාරි විසින් සමරු තිළිණයක් පිරිණමන ලදි.



බුද්ධි අංශය 8 ශ්‍රීලපාහ



## Emergency CALL

## නිතර අවශ්‍ය වන දුරකථන අංක

**119** පොලිස් හදිසි ඇමතුම් ඒකකය
ආරක්ෂාව සම්බන්දයෙන්, ඔබට කරදරයක් වූ විට

**1939** ජාතික ජල සම්පත් හා ජලප්‍රවාහන මණ්ඩලය
හදිසි ජල කාන්දුවීමක්, ජලය නොලැබීයාමකදී

**1987** ශ්‍රී ලංකා විදුලි බල මණ්ඩලය
හදිසි විදුලිය විසංදි වීමකදී

**1900** විදුලි සංදේශ නියාමන කොමිෂම
ඔබගේ දුරකථනය අස්ථානගත වීමක දී

**1989** විදේශ සේවා නියුක්ති කාර්යාංශය
ඔබ විදේශ ගතවීමට පෙර හෝ පසු එම ස්ථානවල තොරතුරු දැනගැනීමට හා විදේශයකදී අතරමන්වී ඇති කෙනෙකු පිළිබඳ තොරතුරු ලබාදී සහනයක් ලබාගැනීමට

**1954** අල්ලස් හා දූෂණ විමර්ශන කොමිෂන් සභාව
වංචාවක් දූෂණයක් පිළිබඳ දැනුවත් කිරීමට

**1969** අධිවේගී මාර්ගය
අධිවේගී මාර්ගයේදී ඔබ අනතුරකට ලක්වූ විටක දී

**110** රාජ්‍ය ගිනි නිවීමේ ඒකකය
හදිසි ගිණිගැනීමක දී

**1905** රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යංශය
සියලුම රාජ්‍ය ආයතනවල තොරතුරු ලබාගැනීමට

**1911** ශ්‍රී ලංකා විභාග දේපාර්තමේන්තුව
සියලුම විභාග වල ප්‍රතිඵල සහ තොරතුරු ලබාගැනීම සඳහා

**1919** රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය
අමාත්‍යංශ වල හා රාජ්‍ය ආයතනවල තොරතුරු දැනගැනීමට

**1929** ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධිය පිළිබඳ අමාත්‍යංශය
කුඩා දරුවන් හිංසනයට ලක්වීමක් පිළිබඳ දැනුම් දීමට

**1938** ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යංශය
කාන්තාවන්ට සිදු වන හිංසනයන් පිළිබඳ දැනුවත් කිරීමට

**1955** ජාතික ගමනාගමන කොමිෂන් සභාව
දුර ගමන් වලදී මගීන්ට සිදුවන අපහසුතාවයන් පිළිබඳව දැනුම් දීමට

**1973** ශ්‍රී ලංකන් ගුවන් සේවය
ගුවන් යානා පිළිබඳව තොරතුරු දැනගැනීමට

පොත පත ඇසුරෙන් සකස් කළේ
කපිතන් එම්ඩී දසනායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ




# Sewa Wanitha Donation

# ශිෂ්‍යාධාර

ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාව මඟින් රෙජිමේන්තු මධ්‍යස්ථානයට අයත් රණවිරුවන්ගේ සුබ සාධක කටයුතු ඉටු කිරීමේ පරමාර්ථය ඇතිව සෑම වර්ෂයක් පාසාම සිදුකරනු ලබන සුබ සාධන කටයුතුවල තවත් පියවරක් වශයෙන් 2015 වර්ෂය වෙනුවෙන් ශිෂ්‍යත්ව/නිවාස ආධාර සහ වෛද්‍යාධාර ලබාදීමේ උත්සවයක් 2015.12.03 වන දින ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ ගරු සභාපතිණී, ධනංජනී කරුණාසේකර මැතිණියගේ සහභාගීත්වයෙන් රෙජිමේන්තු මධ්‍යස්ථාන ප්‍රධාන දේශණ ශාලාවේදී පැවැත් විය. මෙම අවස්ථාවට රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක තුමන් හා නියෝජ්‍ය සේනාවිධායක තුමන් ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරින් හා ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන් ද සහභාගි වන ලදි.

ඡායාරූ : ලාකෝ පත්මසිරි යූඩීචන්
(වයිට්හැකල් ඡායාරූප අංශය)











# අභිමංසල නේවාසික රණවිරුවන්ගේ සුව දුක් බලන්නට යයි







ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ ගරු සභාපතිනි ධනංජනී කරුණාසේකර මැතිනියගේ හා සෙසු සාමාජිකාවන්ගේ සහභාගිත්වයෙන් 2015.12.06 වන දින කඹුරුපිටිය අභිමංසලේ නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන්ගේ සුවදුක් සොයා බැලීම සඳහා එහි සංචාරයක් කල අතර, එහිදී එම මධ්‍යස්ථානයේ සුබ සාධක කටයුතු සඳහා විශේෂ පරිත්‍යාගයක් සිදුකරන ලදි.







# නිවාස ආධාර



යුද්ධ හමුදා සුබසාධක අධ්‍යක්ෂක මණ්ඩලයේ හා ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ මූල්‍ය දායකත්වය ද ඇතිව 4 ශ්‍රීලපාහ ඒකකයේ ශ්‍රමදායකත්වයෙන් සෙ/312022 ලාකෝ කපිලරත්න වයිආර්ටීපීඑන් (මියගිය) ඥාතීන් වෙත නව නිවසක් ඉදිකර දීම සඳහා 2015.11.10 වන දින කුරුණෑගල ඉබ්බාගමුව ප්‍රදේශයේ ඔවුන්ට අයත් ඉඩමේ දී මුල්ගල තබන ලදි.



යුද්ධ හමුදා සුභ සාධක අධ්‍යක්ෂක මණ්ඩලයේ හා ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ මූල්‍ය දායකත්වය ද ඇතිව 8 ශ්‍රීලපාහ ඒකකයේ ශ්‍රමදායකත්වයෙන් සෙ/321394 කෝප්‍රල් මධුසංඛ එච්එම්ටීපී (ආබාධිත) වෙත නව නිවසක් ඉදිකර දීම සඳහා 2015.11.12 වන දින කුරුණෑගල අඹන්පොළ ප්‍රදේශයේ ඔහුට අයත් ඉඩමේ දී මුල්ගල තබන ලදි.



යුද්ධ හමුදා සුභ සාධක අධ්‍යක්ෂක මණ්ඩලයේ හා ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ මූල්‍ය දායකත්වය ද ඇතිව 7 ශ්‍රීලපාහ ඒකකයේ ශ්‍රමදායකත්වයෙන් සෙ/300230 සැරයන් විජේසිංහ එන් (මියගිය) රණවිරුවාගේ ලඟම ඥාතීන් වෙත නව නිවසක් ඉදිකර දීම සඳහා 2015.11.23 වන දින ගාල්ල දොඩන්දුව ප්‍රදේශයේ ඔවුන්ට අයත් ඉඩමේ දී මුල්ගල තබන ලදි.

# නික්මයන අණදෙන නිලධාරී තුමනි
# ඔබටයි මේ උත්තමාචාරය









1 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ 26 වන අණදෙන නිලධාරී වශයෙන් 2013.01.10 වන දින ලුතිතන් කර්නල් ඩීඩබ්ලිව් තාබෲ ආර්ඩබ්පි ආර්එස්පි පීඑස්සි ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ නිලධාරී විසින් අණ දීම භාර ගන්නා ලද අතර, වර්ෂ 1950 ක් වු මැයි මස 12 වන දින ආරම්භ වු මෙම බළඇණිය ජාතියට කල සේවය ඇගයීමක් ලෙස 1954. 04. 21 දින රාජිණි වර්ණයන්ගෙන් ද, 1978.10.10 වන දින රෙජිමේන්තු වර්ණ සහ ජනාධිපති වර්ණයන්ගෙන් පිදුම් ලබා ඇත. වසර 37 ට පසුව 2015.10.26 දින ජනාධිපති හා රෙජිමේන්තු වර්ණ මෙම බලඇණිය වෙත ප්‍රතිප්‍රධානය කරන ලදී.

1975 වර්ෂයේ සිට වසර 40 ක ඉතිහාසය ඇතුලත් ග්‍රන්ථය සකස් කර 2015.10.26 වන දින රෙජිමේන්තු අධිපති තුමාගේ සුරතින් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා වෙත ප්‍රධානය කරන ලදි. ඉන් පසු මෙය 2015.10.27 වන දින අණදෙන නිලධාරී තුමාගේ සුරතින් ඒකකයේ සියලුම නිලයින් හටද ලබා දෙන ලදී. එමෙන්ම මෙම ඒකකයට ස්ථිර නිවහනක අවශ්‍යතාවය පැවති අතර, අණදෙන නිලධාරී තුමාගේ උපදෙස් හා නියෝග පරිදි 2015 වසරේ දි ඉංගිරිය රයිගම් වත්තේ කොටසක ලබාගත් ඉඩමේ ඉදිකිරීම් කටයුතු 2015.11.23 වන දින රෙජිමේන්තු අධිපති තුමාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කරන ලදී. තවද, ඒකකය තුල ඒකපුද්ගල සංගිත කණ්ඩායමක්ද ආරම්භ කල එතුමන් බළඇණිය වෙනුවෙන් විශාල මෙහෙවරක් ඉටුකර වසර 03 කට ආසන්න කාලයක් අණදීම සිදුකර නික්මයාම නිමිත්තෙන් 2015.12.26 වන දින ඒකක වර්ණ සමගින් සම්මාන පෙලපාලියක් ලබාදීමෙන් පසු 2015.12 28 වන දින ඒකකයෙන් නික්ම යන ලදී. එතුමන් හට ඉදිරි ජීවිතය සාර්ථක වේවායි ඒකකයේ සියලුම නිලයින් මෙසේ ප්‍රාර්ථනා කරන්නෙමු.

## 27 වන අණදෙන නිලධාරි ගේ පැමිණීම



2015.12.28 1 ශ්‍රීලපාහ 27 වන අණදෙන නිලධාරි ලෙස නි/63010 ලුතිතන් කර්නල් ආර්ඒ සමරනායක පීඑස්සි ශ්‍රීලපාහ රාජකාරි භාරගත් අතර, එයට සමගාමීව 2015.12.29 වන දින යුද්ධයේදි මියගිය රණවිරුවන්ට පිං පැමිණවීම හා ආබාදිත රණවිරුවන්ට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කිරීම සඳහාත් ලේ දන්දිමේ පිංකමක් පනාගොඩ කඳවුරේදි පවත්වන ලද අතර, ඒ සඳහා රණවිරුවන් 119 දෙනෙකු තම රුධිරය පරිත්‍යාග කරන ලදී.



JOURNAL OF THE SRI LANKA LIGHT INFANTRY
The WHITE HACKLE 86 ISSUE OCT - DEC
ශ්‍රී ලංකා පාබල හමුදා සඟරාව
இலங்கை காலாட் படை சஞ்சிகை | වයිට් හැකල්

# කඨින මහා පිංකමට සැරසෙන යාපනයේ නාග විහාරය



යාපනය නාගවිහාරයෙහි වාර්ෂිකව පවත්වනු ලබන කඨින පිංකමට පෙර එහි දාගැබ හා විහාරස්ථානය අවට තින්ත අලේප කර අලුත් වැඩියා කිරීමේ මහඟු කරතව්‍යට උරදුන් මෙම ඒකකයේ අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් වීඩීඩීඑස් පෙරේරා ශ්‍රීලපාහගේ මගපෙන්වීම මත සියලුම නිලයින්ගේ ශ්‍රම දායකත්වයෙන් 2015.10.21 වන දින සිට 2015.11.07 වන දින දක්වා කාලය තුල සිදු කෙරිණි. 2015.11.07 හා 08 යන දිනයන්හි විහාරස්ථානයේ එම කඨින පිංකමටද දායකත්වය ලබා දෙන ලදි.







JOURNAL OF THE SRI LANKA LIGHT INFANTRY
The WHITE HACKLE 86 ISSUE OCT - DEC
ශ්‍රී ලංකා පාබල හමුදා සඟරාව
இலங்கை காலாட் படை சஞ்சிகை | වයිට් හැකල්

# 55 සේනාංකාධිපති 18 ශ්‍රීලපාහට එයි

55 වන සේනාංකයේ නව සේනාංකාධිපති වශයෙන් රාජකාරි භාරගත් බ්‍රිගේඩියර් එන්ඒ ධර්මරත්න ආර්ඩබ්පි,ආර්එස්පි,එන්ඩියු,පිඑස්සි යන ජ්‍යෙෂ්ඨ නිලධාරි 2015.09.18 වන දින මෙම ඒකකයේ සංචාරය කරන ලදි. සේනාංකාධිපති තුමාගේ එම සංචාරයේදි ඒකකයේ සියළුම ආයතනයන් පරීක්ෂාවට ලක් කරන ලද අතර, දැනට ඒකකයේ අඩුපාඩුව පවතින අවශ්‍යතාවයන් ලබාගැනිම සඳහා අවශ්‍ය ඉදිරි උපදෙස් අණදෙන නිලධාරි මේජර් එච්එම්පිසි හේරත් ශ්‍රීලපාහ වෙත ලබාදෙන ලද අතර, එමෙන්ම මෙම සංචාරය සඳහා 551 බළසේනාධිපති කර්නල් එස්එම්එස්පිබි සමරකෝන් ආර්ඩබ්පි, ආර්එස්පි යන ජ්‍යෙෂ්ඨ නිලධාරීද සහභාගි වූ අතර සේනාංකාධිපති තුමන් ඒකකයේ සංචාරය සනිටුහන් කරමින් සමරු පොතෙහි සටහනක් තබමින් කඳවුරු භූමියෙන් නික්ම යන ලදි.











# සිතක සේයා

## සෙබල සිතක සිතිවිලි....

## සුන්දර ගැහැණුන් අසුන්දර වීම

සුන්දර ගැහැණුන් මදක් ආඩම්බර වූ විට
වඩාත් සුන්දරයි...
එහෙත් අසුන්දර ගැහැණුන් සුන්දර යැයි සිතා
ආඩම්බර විමට යාමේදි ලොව තිබෙන අසුන්දර
රූප රාමුව බවට පත් වෙයි...

**සෙ/18ඩී00689 සාසෙ බංඩාර අර්එම්ජිඑස්**
**18 (සෙව්) ශ්‍රීලපාහ**

## අප්පච්චි

අප්පච්චී ඔයා ගියහම
මට තමයි පාලු
ඔයාටනම් යාලු මාමිලා ගොඩාරියක් ඉන්නවා
මට ඉන්නේ ඔයා ගෙනත් දිපු ටෙඩියා විතරයි
ඒත් එයාට කථා කරන්න බෑනේ
අම්මි කිවා අප්පච්චි ගියාමලු තවත් මාමා කෙනෙකුට
එයාගේ ගෙදර යන්න පුලුවන් කියලා
ඒ නිසා අප්පච්චි යන්න ඒ මාමාටත් මම වගේම
බබෙක් ඇතිනේ
හැබැයි අම්මට කියන්න ඔයා ගියහම
තනියෙන් අඬන්න එපා කියලා
එතකොට මටත් ඇඬෙනවා............

**සෙ/316076 කෝප්‍රල් අමල් දුමින්ද ඒඑල්**
**සි කණ්ඩායම 19 ශ්‍රීලපාහ**

## රණවිරුවනේ

මහ මෙරක් අවි අරන්
රණබිමේ දිවි නැසූ
හෙල දනව් ජය ගමින්
විරුවනේ ඔබ දිනූ

වෙඩි හඬට බිය නොවී
ගත සිතින් දැඩි වෙවී
කොටි දනන් දනගැසූ
විරුවනේ ඔබ මගේ

මතු දින නොම වෙයන්
මේ වගේ යුද බිමක්
පණ නැසූ විරු දනන්
අද මෙසේ සමගියෙන්

**සෙ/331820 සාසෙ ආරියවංශ පී**
**15 ශ්‍රීලපාහ**

## මතකයන්...

එදා හිනැවුන තරු පොකුරු
අද අහස අමතක කර ගිහින්
රෑට මැවූ කවි සිතුවම් පද
සමරු හිරු සේ මියගොසින්
බදා සිටියත් අප සිතුම් කන්ද
පවට සැම සේදී ගොසින්
සිතට අවත් කවි සිතුවිලි
බංකරයට සැමදා මියගොසින්........

**සෙ/18ඩී00168 කෝප්‍රල් කමල් නවරත්න ආර්ඩී**
**18 (සෙව්) ශ්‍රීලපාහ "ඩී" කණ්ඩායම**

## ඔබේ පෙම

ගන් දැල යා කරන්
ගලන මහ දිය කදක්
වගෙමයි සෙනෙහසත්
සොයමු කොහොමද ඉමක්
ප්‍රේමය තියනවද
මොන තරම් ලස්සනද
ආදරය ඇත්තමයි
සුන්දරවූ ගින්දරක්
තත්පරෙන් තත්පරේ
දිය උණන උල්පතක්
වගේ මය මට
ඔබේ පෙම දාහයට පැන් පොදක්
ලියන්නට හැකි තරම්
ලියන්නට හැකි මට
ඔබ ගැනම කවි පොතක්
ඔබේ එක සිනාවක්
මට නවාතැන් පොලක්

**සෙ/327846 සාසෙ ප්‍රියදර්ශන ඩබ්පිප**
**15 ශ්‍රීලපාහ**

## අම්මා...

සඳ පෑයූ විට අඹරේ
සනදුර මැකිලා
හිරු පෑයූ විට
ලොවම අද එළි වෙලා
ආවේ හමුදාවට
අම්මාගේ දෑසට කඳුලක් දීලා
මැවුනේ වෙඩි හඩ ඇසෙද්දී
නුඹ රුව හදවත පිරිලා
දින සති ගෙවිලා මාස ගෙවී යයි
කවදාදෝ ගෙදරට යන්නේ
මගේ පුතු එනවා කියා සිපගන්න
නුඹ කඩුල්ල අයිනේ..............

**සෙ/18ඩී00471 සාසෙ**
**ප්‍රේමසිංහ එස්එච්පිඑම් 18 (සෙව්) ශ්‍රීලපාහ**

## වෙන් වූ පෙම්වතියට

වාසනාවේ මියුරු සත්සර
ඔබේ දෙසවන පැතිර යන්නට
ජිවිතේ දුක් කඳුළු නිමවී
කඳුළු පිසදා සිනාසෙන්නට
සැපෙන් සතුටෙන් සැමදාමත්
ඉදිරි දිවි මග සරු කරන්නට
මගෙන් ආසිරි සුබ පැතුම්
පුද කරන්නෙමි තුටින් ඔබ හට

**සෙ/331228 සාසෙ චන්දිමාල් එච්ඩී**
**15ශ්‍රීලපාහ**

## මගේ ආදර අම්මා

| | |
|---|---|
| දස මසක් කුසේ දරන් මා හැදු මගේ | අම්මා |
| අතක් පයක් නොකඩා මා ඇති දැඩි කල | අම්මා |
| ලේ කිරිකර පොවා මා හැදු මගේ සුදු | අම්මා |
| ගෙදරට බුදුන් ඔබමයි මගේ සුදු | අම්මා |
| | |
| අම්මගේ පුතා දැන් කඳවුරෙ | සිටින්නේ |
| අම්මගේ සුවද තවමත් මට | දැනෙන්නේ |
| ඔබ පෙව් කිරිවල බලයයි මට | තියෙන්නේ |
| හැම මොහොතකම ඔබේ රුව මයි | පෙනෙන්නේ |

**සෙ/323606 කෝප්‍රල් සඳරුවන් ඩබ්ඩීසී**
**අණ සහ පාලන කණ්ඩායම 15 ශ්‍රීලපාහ**

## තාත්තා

නොහඬා හඬන
දුක දැරුවද නොදැරුවා සේ
ලේ කිරි නොකෙරුවද
ලේ දා බිඳු කරන....

**මේජර් ඒඩී ගුණරත්න ශ්‍රීලපාහ**

## මතකය

අමතක කරන්නට
හැකි සේම
යටගියාවට
යලි පණදෙන්නට
හැකියාව ඇත්තෙ

## මගේ ලොවේ උතුම් මිනිසා

| | |
|---|---|
| රට දැය රැකුමටයි | තාත්තේ |
| ඔබ එදා පෙරමග | ගත්තේ |
| සිතුවේ නැ මා කෙදිනකවත් | මෙලෙසේ |
| ඔබ මා තනිකර යන්නට | වුයේ |
| | |
| රණබිමේ ඔබ දිවිය පුජා | කළත් |
| දැක්කේ නෑ ඔබගේ ආදර | මුණවත් |
| සීල් කරපු පෙට්ටියක් අප හට | දුන්නත් |
| තරහක් නෑ මා කවුරුත් | සමගත් |
| | |
| පිතු පාදං කියා නමදින්නට මා | හට |
| කෝ තාත්තේ ඔබ නැහැ මා | ළග |
| ආසයි අසන්නට එවදන් තවමත් | මම |
| නොහැකිය සිතන්නට ඔබ මෙලොවින් සමුගත් | බව |
| | |
| මගේ ලොවේ උතුම් මිනිසා | ඔබයි |
| දිවිමග කියා දුන් හෙළ පියාණන් | ඔබයි |
| අප සැමගේ සිත් දිනා ගත්තේ | ඔබයි |
| මගේ සදාදර තාත්තා | ඔබයි |

**2009 පෙබරවාරි මස 01 දින මව්බිම වෙනුවෙන් ජිවිතය පුජාකළ විරෝධාර සෙන්පති මේජර් (උපා) ඩීආර් ප්‍රනාන්දු මාගේ ආදර පියාණන්ට මෙය උපහාරයක්ම වේවා! දියණිය චමරි ගයාන්තිකා ප්‍රනාන්දු**






# 2015 අන්තර් රෙපිමේන්තු කරාතේ තරගාවලියේ සිව්වන ස්ථානය ශ්‍රීලපාහ ක්‍රීඩකයින්ට

ඡායාරූ : ලාකෝ පත්මසිරි යූඩීඑන්
(වයිට්හැකල් ඡායාරූප අංශය)

මෙවර 2015 අන්තර් රෙපිමේන්තු කරාතේ තරඟාවලිය රත්මලාන ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්‍ෂක විශ්ව විද්‍යාලයීය ගෘහස්ථ ක්‍රීඩාංගනයේදී 2015 සැප්තැම්බර් මස 10, 11, 12 සහ 14 යන දිනයන් තුල පැවැත්වීය. ෂිතෝරියෝ ෂුකෝකායි කරාතේ දෝ ගිෂින්කාන් සංගමයෙහි සභාපති සෙන්සේ ලක්ෂ්මන් සපරමාදු මහතා යටතේ එහි ප්‍රධාන පුහුණුකරුවකු වන එස් වසන්ත සෙනෙවිරත්න මහතාගේ පුහුණුවීවීම් යටතේ තරඟ කල මෙම ක්‍රීඩකයින් යුහ අන්තර් රෙපිමේන්තු කරාතේ ක්‍රීඩා තරගාවලියකදි ලබාගත් ඉහලම ලකුණු ප්‍රමාණය වන ලකුණු 51 ලබාගනිමින් රන් පදක්කම් 04 ක් රිදී පදක්කම් 04 ක් හා ලෝකඩ පදක්කම් 07 ක් දිනා ගෙන සමස්ථ තරඟාවලියේ සිව්වන ස්ථානය හිමිකරගන්නා ලදී. එහි සුවිශේෂීත්වය වන්නේ පූර්ණ කරාතේ කණ්ඩායමක සිටිය යුතු තරඟකරුවන් සංඛ්‍යාව 87 ක් වන නමුත් ක්‍රීඩකයින් 46 ක ගෙන් සමන්විත ශ්‍රීලපාහ කරාතේ කණ්ඩායම පූර්ණ තරඟකරුවන් සංඛ්‍යාව ඇතුලත් කණ්ඩායම් පරදා 4 වන ස්ථානයට පත්වෙමින් ශ්‍රී ලංකා පාබල හමුදා රෙපිමින්තු කණ්ඩායම තරගාවලියෙහි කිර්තියක් හිමිකර ගැනීමට සමත් වීමයි.

මෙම සංචිතය ශක්තිමත්ව ඉදිරියට රැගෙනයාම සඳහා රෙම කරතේ ක්‍රිඩා සංචිතය භාර 23 වන බළඇණියේ අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එස් විජේසිරිවර්ධන ආර්ඩබ්පී ආර්එස්පී ශ්‍රීලපාහගේ මගපෙන්වීම අගය කොට සලකන අතර, තරඟවැදි සියලුම ක්‍රිඩකයින්ට ඒකකයේ මෙන්ම රෙපිමේන්තුවේ සියලුම නිලයින්ගේ සුභාශිංසනය පුද කර සිටිමු.



## පොදු රාජ්‍ය මණ්ඩලීය කරාතේ තරඟාවලියෙන් ලෝකඩ පදක්කමක් ගෙනා ලාකෝ ඩිල්ශාන්

මෙම ඒකකයට අයත් සෙ/330701 ලාකෝ ඩිල්ෂාන් ඊවීඑන් 2015 සැප්තැම්බර් මස 15 දින සිට 23 දින දක්වා ඉන්දියාවේ නවදිල්ලි නුවර පැවැති පොදු රාජ්‍ය මණ්ඩලිය කරාතේ තරගාවලියේ කේවල කාතා කළු පටි ඉසව්වේ තුන්වන ස්ථානය දිනා ලෝකඩ පදක්කමක් හිමි කර ගැනිමට සමත් විය.

මේ වන විට ශ්‍රීලපාහ රෙපිමේන්තුවට විශාල කීර්තියක් ලබාදි ඇති මෙම ක්‍රීඩකයා 2009 වර්ෂයේ සිට 2015 වර්ෂයන්හිදි පොදු රාජ්‍ය මණ්ඩලිය කරාතේ තරඟාවලිය ඉන්දියාව, ආසියාතික කරාතේ තරගාවලිය ජපානය, ජාතික කළුපටි ශූරතාවය, යුධ හමුදා අන්තර්රෙපිමේන්තු තරගාවලි 2011 සිට 2015 දක්වා, පළාත් කරාතේ තරගාවලි, ක්‍රීඩා අමාත්‍යංශය හා කරාතේ සංගම් මගින් සංවිධානය කරනු ලැබු විවිධ තරඟාවලීන්ට සහභාගිවී දක්‍ෂතා දක්වා ජයග්‍රහණ රැසක් හිමිරගෙන ඇති අතර, මේවනවිට රන් පදක්කම් 12 ක්,රිදී පදක්කම් 03 ක් හා ලෝකඩ පදක්ම් 05 කට හිමිකම් කිමට සමත්වී ඇත. ඔහු තම ඉසව්වෙන් ඉදිරියට යාමට ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමු.





## 61 වන සේනාංක මලල ක්‍රීඩා තරඟාවලියේ

# අනුශූරතාවය 25 ට

61 වන සේනාංකයට අයත් සියලුම බලඇණි අතර පැවති අන්තර් ඒකක මලල ක්‍රීඩා තරඟාවලිය මූලික තරග ජුලි මස 27 හා 28 දිනයන් හිදි  පැවති අතර, මෙම ක්‍රීඩා තරඟාවලියේ සමාප්ති උත්සවය 2015 ඔක්තෝම්බර් මස 27 වන දින වව්නියාව ගුරු විද්‍යාලිය ක්‍රීඩාංගනයේදි අති උත්කර්ෂවත් අයුරින් පවත් වන ලදී. මෙහිදි පැවති අවසන් තරග සියල්ල ඉතා ආකර්ෂණීය මුහුනුවරක් ගත් අතර කරට කර තියුණු තරගයකින් පසුව තනි ඉසව් සදහා රන් පදක්කම් 4 ක්ද, රිදී පදක්කම් 4 ක්ද ලෝකඩ පදක්කම් 4 ක්ද, කණ්ඩායම් තරඟ සදහා ලෝකඩ පදක්කම් 3 ක්ද සමගින් 25 වන බළඇණිය ශ්‍රීලංකා පාබල හමුදාව අනෙකුත් ඒකකයන් අතරින් සමස්ත තරඟාවලියේ අනුශුරතාව ලබා ගැනිමට සමත් විය.මෙම තරඟාවලියේ ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් 61 වන සේනාංකාධිපති බ්‍රිගේඩියර් එස්එච්එෆ්පී පෙරේරා ආර්එස්පි ඇතුලු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක් සහාභාගි වුහ. ඒකකය ලද මෙම ජයග්‍රහනය වෙනුවෙන් අණදෙන නිලධාරී මේජර් එම්ටීඅයි ගුණවර්ධන ආර්එස්පි පිඑස්සි ශ්‍රීලපාහ ඇතුලු සියලුම නිලයන්ගේ ගෞරවය පුදකර සිටින අතර, තරඟාවලියට සහභාගී වූ සියලුම ක්‍රීඩකයින් ගේ ක්‍රීඩා දිවිය මෙන්ම යුද හමුදා දිවිය ද සාර්ථක වේවායි සුභ පතන්නෙමු.



අනුශූරතාවය හිමිකරගත් 25 ශ්‍රීලපාහ ක්‍රීඩා කණ්ඩායම

# 23 වන සංවත්සරය උත්සවශ්‍රීයෙන් සමරයි.




ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ 7 වන සාමාජිකයා ලෙස 1992 වර්ෂයේ නොවැම්බර් මස 20 වන දින මණ්ඩතිව් දූපතේදි ආරම්භ කරන ලද අප බළඇණියේ 23 වන සංවත්සර සැමරුම් උත්සවය අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් එම්පීඑස්පී කුළසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පි ශ්‍රීලපාහගේ ප්‍රධානත්වයෙන් ආගමික කටයුතුවලට මුල්තැන දෙමින්, කිලිනොච්චිය කනගපුරම් කදවුරු භූමියේදි අති උත්කර්ෂවත් අන්දමින් නොවැම්බර් මස 20 වන දින සමරන ලදි.

2015 නොවැම්බර් මස 17 වන දින අණදෙන නිලධාරී තුමන් ප්‍රමුඛ ඒකකයේ සියලුම නිලයින්ගේ සහභාගිත්වයෙන් මුරුක්කන්ලූ පුල්ලෙයාර් කෝවිලේදි පූජාවක් සිදු කිරීමෙන් ඒකකයේ මියගිය හා අතුරුදහන් වූ රණවිරුවන් උදෙසා පිං පමුණුවාලිමත්, යුද්ධයේදි ආබාධිත තත්ත්වයට පත් සියලුම රණවිරුවන් හට නිදුක් නිරෝගි සුවය ප්‍රාර්ථනා කිරීමත්, සේවයේ යෙදි සිටින සියලුම නිලයන්, සිවිල් සේවක මහතුන් හට සහ සියලුම අයගේ පවුල්වල සාමාජිකයින්ටත් සෙත් ප්‍රාර්ථනා කරන ලදි.



2015.11.20 වන අණදෙන නිලධාරීතුමන් වෙත ආචාර සම්මාන මුරයක් සහ ආචාර පෙළපාලියක් ලබාදීමෙන් අනතුරුව එතුමන් විසින් සියලුම නිලයින් අමතා හරවත් දේශනයක් පවත් වන ලදී. එහිදි තමන් උපන් දේශයේ ස්වෛරීභාවය හා භෞමික අඛණ්ඩතාවය ආරක්‍ෂා කරමින් ත්‍රස්ථවාදි ක්‍රියාකාරකම් වලකාලන්නට ඒකකයේ රණවිරුවන් විසින් සිදු කලා වූ අප්‍රමාණ කැපවීම් තුලින් අද අපගේ දූ දරුවන් හට යහපත් හෙට දවසක් නිර්මාණය වී ඇති බව ප්‍රකාශ කලේය. මෙවන් සාමකාමී පරිසරයක 23 වන බළඇණි දිනය සමරන්නට හැකිවීම භාග්‍යයක් කොට සලකන බව ද ප්‍රකාශ කරන ලද අතර, යුද්ධයේදි ජීවිත පිදූ සියලුම රණවිරුවන්ට නිවන් සුව ප්‍රාර්ථනා කරමින් එහිදී ආබාධිත තත්ත්වයට පත් රණවිරුවන් හට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කර දැනට ඒකකයේ රාජකාරි කරන සියලුම නිලයින්ටත් සිවිල් සේවක මහතුන් මෙන්ම සියලුම පවුල්වල සාමාජිකයින් ද මෙහිදී ඉතාමත් කෘතවේදීව සිහිපත් කරන ලදි.



තවද, අණදෙන නිලධාරි ප්‍රමුඛ සියලුම නිලයින් විසින් ජීවිත පරිත්‍යාග කල වීරෝධාර රණවිරුවන් සිහිපත් කරමින් කදවුරු භූමියේ ඉදිකර ඇති රණවිරු ස්මාරකය අභියසදි මල් කළඹක් තැන්පත් කළ අතර බළඇණි දිනය සිහිකිරීම වස් අඹ පැලයක් ද කදවුරු භූමිය තුල රෝපණය කරන ලදි. 2015 නොවැම්බර් මස 24 වන දින රාත්‍රියෙහි ඒකකයේ "SEVEN BEAT" සංගිත කණ්ඩායමේ මියුරු සත්සර රාවය ඒකකයේ සියලුම නිලයින් ප්‍රබෝධමත් කරලීය.






# පාබල මේලා 2015

## වෙළඳ ප්‍රදර්ශනය සහ සැණකෙළිය

ශ්‍රී ලංකා පාබල හමුදා සංවිධාන ශක්තියෙන් පාබල මේලා වෙළඳ ප්‍රදර්ශණය හා සැණකෙළිය ඉතා උත්කර්ෂවත් අයුරින් තෙවන වරටත් හික්කඩුව මහජන ක්‍රිඩාංගනයේදී යුධ හමුදා සංදර්ශන, ජනප්‍රිය සංගීත කණ්ඩායම් හා මෙරට වෙනත් කිසිදු වෙළඳ ප්‍රදර්ශණයකිදී ඇස නොගැටෙන සුවිශේෂි ඉදිරිපත් කිරීම් සමගින් සිතල උදුවප් මස 18 වන දින සිට 22 දින දක්වා මහජනතාව වෙනුවෙන් පවත්වන්නට කටයුතු යෙදුනි.

මෙම සැණකෙළියේ ප්‍රථම දින එනම් 2015 දෙසැම්බර් මස 18 වන දින සමාරම්භක උත්සවය ආරාධිත අමුත්තා වශයෙන් රෙජිමේන්තු අධිපති හා කිලිනොච්චි ආරක්‍ෂක සේනා ආඥාපති වශයෙන් කටයුතු කරනු ලබන මේජර් ජෙනරාල් අමල් කරුණාසේකර ජ්‍යෙෂ්ඨ නිලධාරි සහභාගි විය. තෙවන පාබල මේලාවෙන් එක් දිනක් ඔවුන්ගේ කණ්ඩායම් සංගීත දිවියේ සුවිශේෂී හැකියාවන්ට නතු කරගැනීමට සමත්වූ බව සනිටුහන් කිරීමට ඇරෝස්ටාර් සංගීත කණ්ඩායමට හැකි විය. අතුරු සිදුරු නැතිව මහ ජන ගගක් ගැලූ හික්කඩුව මහජන ක්‍රීඩාංගනය සිසාර සේනානායක වේරලියද්ද, නිහාල් නෙල්සන්, අසංක ප්‍රියමන්ත පීරිස්, ප්‍රදීප් රංගන, ජින්ජර් වයිට් හා රණවිරු රියල්ටාර් ගායක අසේල මනුකුලසූරිය ගේ ගී හඬ රැව්පිළිරැව් දුණි. වේදිකා කථනය ජගත් නාත්තන්ඩිය විසින් සිදු කළ අතර, රංගන දායකත්වය මහරගම පිණිරූ විසිනි.

සැණකෙළියේ දෙවන දින ආරාධිත අමුත්තා වශයෙන් බ්‍රිගේඩියර් ඇඹව ජ්‍යෙෂ්ඨ නිලධාරී සහභාගී වූ අතර, මෙදින රාත්‍රිය වර්ණවත් කිරීමේ භාග්‍යය දිවයිනේ ජනප්‍රිය සංගීත කණ්ඩායමක් වූ නීල් වර්ණකුලසූරිය ප්‍රමුඛ සන්ෆ්ලවර් සංගීත කණ්ඩායමට හිමිවිය. මෙදින ආරාධිත ශිල්පීන් ලෙස සමන් ද සිල්වා, ඊෂාක් බෙග්, ජාලිය රණතුංග, මංජුල වර්ණකුලසූරිය, දමිතා අබේරත්න හා රණවිරු රියල්ස්ටාර් ගායන ශිල්පිණී දර්ශනි අනුරාධා එක්විය. කථනයෙන් නදීක කරුණානායක වේදිකාව හැඩවැඩ කළ අතර, මහනුවර රංගීනා රංගනය ජන හදවත් ඇදබැද තබන්නට හැකි විය. එසේම ඩීමාක් යතුරුපැදිකරුවන් විසින් ඉදිරිපත් කළ ත්‍රාසජනක ඉදිරිපත් කිරීම හික්කඩුව ජනතාවට කිසිදිනක අමතක නොවනු ඇත.

මේජර් ජෙනරාල් කාවීන්ද ගුනවර්ධන ජ්‍යෙෂ්ඨ නිලධාරී ආරාදිත අමුත්තා වශයෙන් තෙවන දිනයේදී ආරම්භය ලබාදුන් සැණකෙළි භූමිය සංගීත ලෝලීන්ගේ පාරාදීසයක් බවට පත් කරන්නට සීදුව සකුරා සංගීත කණ්ඩායමට හැකියාව ලැබූ බව පැමිණ සිටි මහා ජන ගග සාක්ෂි දැරී ය. ප්‍රවීණ නිවේදක ශිල්පී ජගත් නාත්තන්ඩිය විසින් මෙහෙය වූ වේදිකාව දමිත් අසංක, ප්‍රියන්ත ප්‍රනාන්දු, චන්දන ලියනාරච්චි, ශානිකා වනිගසේකර, අතුල අධිකාරී, සමගින් ලුතිතන් කර්නල් ලක්ෂ්මන් ප්‍රනාන්දු යන ශිල්පීන් රාත්‍රිය වර්ණවත් කිරීමට සමත් විය. මෙදින නර්ථන වින්‍යාශය නිට්ටඹුව රංගනාවෝ විසිනි.

සිව්වන දිනයේ දී ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් සපැමිණියේ කොතලාවල ආරක්‍ෂක විශ්ව විද්‍යාලයේ උප කුලපති ලෙසින් කටයුතු කරනු ලබන මේජර් ජෙනරාල් ජේආර් කුලතුංග ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී විසිනි. මෙදින පැමිණ සිටි අති විශාල ජනකාය අමන්දානන්දයට පත් කරමින් සනිධප සංගීත කණ්ඩායම සංගීතවත් වූ අතර, කථනය ඩෙන්සිල් නුගේගොඩ විසිනි. මෙදින ධනපාල උඩවත්ත, රොමෙල් සුගතපාල, දසුන් මදුසංක, සමන් ලෙනින් සුප්‍රියා අබේසේකර සහ අයෝමී පෙරේරා වැනි සුවිශේෂී කලාකරුවන් රැසක් දායකත්වය එක්කොට තිබුනි. කටුනායක තුෂී විත් සෙෂන් වන් ඉදිරිපත් කළ රංගනය කිසිදා අමතක නොවන සටහනක්ම විය.

පස්වන දිනය  එනම් 2015 දෙසැම්බර් මස 22 වන දින සැණකෙළියේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආසේමු (බටහිර) අඥාපති සහභාගී වූ අතර, පාබලමේලා ලොතරැයිය දිනුම් ඇදීමේ කටයුතු වෙනුවෙන් පාබල රෙජිමේන්තු අධිපති හා ආසේමු (කිලි) ආඥාපති මේජර් ජෙනරාල් අමල් කරුණාසේකර මැතඳුන්ගේ දායකත්වය සටහන් විය. ශ්‍රී ලංකාවේ ජනප්‍රියත්වයේ හිණිපෙත්තෙහිම සිටින ෆ්ලෑෂ්බෑක් සංගීත කණ්ඩායමේ මියුරුසර ගුවනට එක් වූ මෙදින ආත්මා ලියනගේ, තීක්‍ෂණ අනුරාධ, රොඩ්නි වර්ණකුල, සුරෙනි ද මේල්, උදයංග පෙරේරා සමගින් බ්‍රිගේඩියර් ජයනාත් ජයවීරයන් හට ගායනයෙන් වේදිකාව සැරසවීමට ඉඩ හසර ලැබුණි. අවසන්දිනයේ ගැලූ ජන ගග  සැණකෙලියේ අවසන් මොහොත දක්වාම රඳවා තබාගැනීමට ප්‍රවීන නිවේදක ඩෙන්සිල් නුගේගොඩට හැකි වූ අතර, අමතක නොවන රංගනයෙන් රසිකයන් පිණවීමට මීගමුව අමාලි විත් ස්ටාර් ඩාන්ස් රංගන ශිල්පීන්ට හැකියාව ලැබුණි. අවසන් දිනය සමගින්  තෙවන පාබලමේලා වෙළඳ ප්‍රදර්ශනය හා සැණකෙළිය සමාප්තියට පත් වූ අතර, පළමු දිනයේ සිට අවසන් දිනය දක්වා සුවිශේෂී ඉදිරිපත් කිරීම් කළ රෙජිමේන්තු සරඹ කණ්ඩායම හා සංස්කෘතික නැටුම් කණ්ඩායම වෙත ද මෙහි වැදගත් තැනක් හිමි වූ අතර,  අවසන් වශයෙන් මෙම සැණකෙළිය සාර්ථක කරගැනීමට නන් අයුරින් දායක වූ සියලු දෙනා හට රෙජිමේන්ත අධිපති තුමන් ඇතුලු සියලුම නිලයින් වෙනුවෙන් කෘතඥ පූර්වක ස්තූතිය මෙයින් පිරිණමන්නෙමු.

සටහන : වයිට්හැකල් ප්‍රකාශන අංශය



# කකුලේ ඇඟිලිකරු වනවීමට හේතු සහ ඒ සඳහා ප්‍රතිකාර



## කකුල්වල ඇඟිලි කරු වන වීමක් යනුවෙන් අදහස් කරන්නේ කුමන තත්වයක්ද?

කකුලේ ඇඟිලි අතර ඇතිවන දිලීරමය විෂබීජ තත්වයකි (Tinea Pedis ) මෙය බොහෝවිට නිතර සපත්තු පලදින අයගේ බහුලව දැකිය හැක. බොහෝවිට දීර්ඝ කාලීනව පවතින මෙය හරියාකාරව ප්‍රතිකාර නොකිරීමත්, කකුලේ පිරිසිදු බව අඩුවීමත් යන කරුනු දෙකම මුල්කරගෙන නැවත නැවත මතු වීමේ හැකියාව ඇත.

## මෙම තත්වය ඇතිවීමට හේතු කවරේද?

කකුලේ ඇඟිලි කරු අතර නිතර තෙත්ව තිබීම මීට බලපාන ප්‍රධානතම හේතුවයි. දීර්ඝ වේලාවක් සපත්තු පැලද සිටීමේදී කකුලට දහඩිය දැමීමත් ඒවා වැඩි වේලාවක් රැඳී පැවතීමත් මෙසේ දිලීර රෝග ඇති වීමට හේතුකාරකවේ.

මීට අමතරව මෙම රෝගී තත්වය ඇති අයෙකුගේ පාවහන් පැලදීමෙන් මෙම දිලීර රෝගය තවකෙනෙකුට වැලදිය හැක.

## මෙහිදී එන රෝග ලක්ෂණ මොනවාද?

කකුලේ ඇඟිලි අතර කැසීම. පතුරු ගැලවීම.(සුදුපැහැති පතුරු ලෙස) සමහර අවස්ථාවලදී වතුර වැනි යමක් පිට වීම. කැසීමත් සමග තුවාල ඇතිවීම හා සමහර අවස්ථාවලදී කැක්කුම ඇතිවීම.

විෂ බීජ තත්ව ඇතිවීම. නියපොතුවලට පැතිරුනු අවස්ථාවලදී නියපොතු අවපාට වීම, ඝනකම් වීම හා කැඩී යාම සිදුවිය හැක.

## මේ සඳහා ඇති ප්‍රතිකාර මොනවාද?

දිලිරනාශක ක්‍රීම් වර්ගයක් හෝ පවුඩර් වර්ගයක් (උදා Micanazole , Clotrimazole) ආලේප කිරීම. (මෙය ඇඟිලිකරු අතර වන වීම නැතිවූ පසුත් සති කිහිපයක් සති 2ක් පමණ ආලේප කරන ලෙස වෛද්‍යවරයා උපදෙස් දෙනු ඇත) කකුල් හොඳින් සබන් දා සේදීම හා ඇඟිලි කරු අතර හොඳින් තෙත මාත්තු කිරීම. මෙය දවසකට දෙවතාවක්වත් සිදුකිරීම. සපත්තු හොඳින් පිරිසිදු කිරීම. අව්වේ දමා වේලීම, මේස් හොඳින් සෝදා හොඳින් අව්වේ දමා වේලීම.

## තෙත සපත්තු හා මේස් දැමීමෙන් වැලකීම.

අනෙක් අයගේ සපත්තු මේස් දැමීමෙන් හැකිතරම් ඈත් වීම. කකුල ඉදිමී රතු වී ඇත්නම් වහාම නැවත වෛද්‍යවරයා වෙත යොමුවිය යුතුවේ. එය වෙනත් විෂ බීජ තත්වයක් නිසා විය හැකිවේ. දියවැඩියා රෝගීන් මෙවැනි තත්ව වලට ඉක්මනින් ක්‍රමාණුකූලව ප්‍රතිකාර ගත යුතුය. නැතහොත් තුවාල විශාල වී කකුල් ඉවත් කරන මට්ටමක් දක්වා වර්ධනය විය හැක.

## මෙවැනි තත්ව ඇති වීම වලක්වා ගන්නේ කෙසේද?

- සපත්තු භාවිතා කිරීමේදී නිතර මාරු කිරීම හා පිරිසිදු මේස් භාවිතා කිරීම.
- කකුල් දිනකට දෙවරක්වත් හොඳින් සේදීම.(විශේෂයෙන් සවසට සපත්තු ගැලවූ පසු)
- කකුල්වල තෙත ගතිය ඇත්තේ නම් නිතර, නිතර තෙත මාත්තුකර හැරීම.( විශේෂයෙන් ඇඟිලි කරු අතර)
- මුලික කැසීම ආරම්භ වනවාත් සමග ඊට ප්‍රතිකාර ගැනීම.
- පොදු ස්ථානවල ඇවිදීමේදී විශේෂයෙන් නාන තටාක ආශ්‍රිතව සෙරප්පු පාවිච්චි කිරීම.




Micanazole




Clotrimazole

අන්තර්ජාලය ඇසුරෙන්
වයිට් හැකල් ප්‍රකාශන අංශය



# බීමත්ව සිටියදී සිදු කරන වැරදි සඳහා දඬුවම්

මත් ද්‍රව්‍ය නිසා අද සමාජය සංකාර්ණ වී ඇත. මත් ද්‍රව්‍ය වලට ඇබ්බැහි වු පුද්ගලයින් සිදු කරන්නා වු වැරදි වලින් සිදුවන සමාජමය හානිය අන් කවරදාටත් වඩා වැඩි වි ඇත.

පවුල් ආරවුල්, ස්ත්‍රී දුෂණ, සොරකම්, මිනි මැරුම් සහ මංකොල්ල කෑම් යනාදි වැරදි රාශියක් මත් ද්‍රව්‍ය අබ්බැහියත් සමග ඈදී ඇත. බොහෝ පුද්ගලයින් මත්ද්‍රව්‍ය භාවිතා කළ පසු වැරදි වලට නැඹුරු විමේ ප්‍රවනතාවයක් ඇති බව අධිකරණයට ඉදිරිපත් වන නඩු දෙස බැලිමේදි පැහැදිලිව පෙනි යයි. මෙවැනි අපරාද වැරදි පමණක් නොව දික්කසාද වැනි සිවිල් ආරවුල් වලටද තුඩු දි ඇත්තේ පුද්ගලයින්ගේ බිමත් භාවයයි. යම් පුද්ගලයෙක් බිමත්ව සිටියදි සිදු කරනු ලබන වැරදි සම්බන්ධයෙන් දඩුවම් කිරිම සඳහා විදි විදාන සැලැස්විම් අරමුණු කරගෙන 1979 අංක 41 දරණ බිමත්ව කරන වැරදි පිළිබඳව (විශේෂ විධි විධාන) පනත නීති ගත කර ඇත. එම පනතට අනුව යම් ප්‍රසිද්ධ ස්ථානයකදි බිමත්ව හැසිරෙන පුද්ගලයින් වැරදිකරුවන් වේ.

ඊට අමතරව බිමත්ව පොදු දේපල වලට අලාභ හානි සිදු කරන පුද්ගලයින්ට අධිකරණය ඉදිරියේදි නඩු පවරා වරදකරු කරනු ලැබු විට මාස හයකට නොඅඩු හා අවුරුදු 02 කට නොවැඩි බන්ධනාගාරගත කිරිමකින් කඩුවම් කරලු ලැබේ. එසේම රුපියල් දහසත් දෙදහස් පින්සියයත් අතර දඩයකටද යටත් කරනු ලැබිය හැක.

බිමත්ව සිදු කරනු ලබන වැරදි සම්බන්ධයෙන් පමණක් නොව මත් පැන් විකුණන පුද්ගලයින් සම්බන්ධයෙන්ද මෙම පනතේ ප්‍රතිපාදන සපයා ඇත. ඒ අනුව වයස අවුරුදු 12ට අඩු දරුවෙකුට මත් පැන් ලබාදෙන තැනැත්තන් ද මේ යටතේ වරදකරුවන් වන අතර වයස අවුරුදු 18ට අඩු දරුවෙකුට මත් පැන් විකුණන තැනැත්තෙකුට මාස 06ක් හා අවුරුදු දෙකක් අතර කාලයක් සඳහා බන්ධනාගාරගත කිරිමක්ද රුපියල් දහසක් හා දෙදහස් පින්සියයක් අතර දඩයක්ද අධිකරණය විසින් නියම කරනු ලබයි.

පොදු ස්ථානයකදි බිමත්ව සිටිමින් හා මත් පැන් පානය කරමින් සිටින විට අත් අඩංගුවට ගන්නා පුද්ගලයින් සතුව ඒ අවස්ථාවේ පවතින මත් පැන් තහනමට ගෙන අධිකරණයේ නියෝගය මත විනාශ කර දැම්ම සඳහා පනතේ ප්‍රතිපාදන සලසා ඇත.

විශේෂයෙන් මෙම පනත යටතේ කරන වැරදි සඳහා වරෙන්තුවක් නොමැතිව අත් අඩංගුවට ගැනිමටද අවස්ථානුකුලව සාධාරණ බලයක් පාවිච්චි කිරිමටද පොලිස් නිලධාරින්ට බලය ලබාදි ඇත.

මෙම පනත යටතේ යම් පුද්ගලයෙකුට අත් අඩංගුවට ගත් පසඅ එම පුද්ගලයා සත්‍ය වශයෙන්ම බිමත්ව සිටිද යන්න නිශ්චය කර ගැනිම සඳහා හැකි ඉක්මනින් එම පුද්ගලයාට ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියෙකු ලවා පරික්ෂා කරවිය යුතුය.

ප්‍රශ්වාස විශ්ලේෂණ පරිකෂණයක් කිරිම අවශ්‍ය වන්නේ නම් නියෝග වලට අනුකුලව අනුමත ඔපරේටර්වරයෙකු ලවා එය සිදු කළ යුතුය. මෙම පරික්ෂණ සඳහා බාධා කරන පුද්ගලයෙකු අධිකරණයට ඉදිරිපත් කළ යුතු අතර මාස 06 කට නොඅඩු කාලයක් සඳහා බන්ධනාගාරගත කරනු ලැබිය හැකිය. එම තැනැත්තා දඩයකටද යටත් කරනු ලැබිය හැකිය.

මීට අමතරව මෙම පනත යටතේ වරදක් කරන පුද්ගලයෙකුගෙන් එම වරද සිදු කරන වේලාවේ මත් පැන් ගඳ වහනය වන්නේ නම් හෝ ඒ බව සාධාරණ ලෙස පෙනී යන්නේ නම් ඒ තැනැත්තා බිමත්ව සිටින බවට පුර්ව නිගමනය කළ යුතු බව පනතේ සඳහන් වි ඇත. එසේම එම පුද්ගලයා බිමත්ව සිටින්නෙකු බවට රජයේ වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව හෝ එම පුද්ගලයාගේ රුධිරයේ ඇති මධ්‍යසාර සාන්ද්‍රණය සම්බන්ධයෙන් අනුමත ඔපරේටර් වරයාගේ වාර්තාව අධිකරණයේ දි ප්‍රමානවත් සාක්ෂියක් වෙයි.

මෙම පනත යටතේ වරදක් කරන පුද්ගලයෙකුට එරෙහිව එම වරද සම්බන්ධයෙන් නඩු පවරා වත්වාගෙන යාමේ අධිකරණ බලය ඇත්තේ මහේස්ත්‍රාත් අධිකරණයටයි.

ඒ අනුව මෙම පනත මගින් බිමත් තැනැත්තන් විසින් සිදු කරනු ලබන වැරදි වලට දඩුවම් වැඩි කිරිම අපේක්ෂා කර ඇත. සමාජයට හානියක් වි ඇති මෙකී වැරදි කිරිමෙන් මිනිසුන් මුදා ගැනීම මෙහි අරමුණයි. අනෙක් අතට බිමත් පුද්ගලයන් සම්බන්ධයෙන් නිසි කාර්ය පටිපාටියක් අනුගමනය කරනු ලබිමද පනත මගින් අපේක්ෂිත වේ. එනම් පොලිස් නිලධාරින්ට හිතුමතේ ක්‍රියා කරමින් අහිංසක පුද්ගලයන්ව වැරදි වලට හසු කිරිමේ අභිමත බලය මෙයින් අහෝසි කරමින් වෛද්‍ය වාර්තාව හෝ ප්‍රාශ්වාශ විශ්ලේෂව වාර්තාව අනිවාර්යය කිරිම සිදුකර තිබේ.

සටහන
නීතිඥ අනුරාධා රත්නමලල

සබ්බ දානං ධර්ම දානං ජිනාති

# බුද්ධ ප්‍රතිමා වහන්සේ නිරාවරණය කිරීමේ පුණ්‍යෝත්සවය

ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුව



ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රය තුල ඉදිවී ඇති බෞද්ධ විහාරස්ථානය නිබඳවම වන්දනාමානයන්ට පාත්‍ර වෙමින් පාබල මෑණියන්ට අභිමාණයක්, ගෞරවයක් එක් කරමින් තිබේ.. 2015 නොවැම්බර් මස 22 දින එය නවීකරණය කර වන්දනාමාන පහසුකම් තවත් වැඩිදියුණු කරමින් සමාධි සුවයෙන් වැඩ සිටින සම්බුද්ධ ප්‍රතිමා වහන්සේ නමක් ද වැඩහිදුවා නව මුහුණුවරකින් විවෘත කරන දිනය උදා විය. එකල ලුතිතන් ජෙනරාල් එච්වි අතුකෝරල වීඑස්වී පීඑස්සී එෆ්බීඅයිඑම් ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන්ගේ සංකල්පයක් මත ස්ථාපිත කෙරුණු මෙම විහරස්ථානය වසර කීපයකට පසු හිටපු යුද්ධ හමුදාධිපති ජෙනරල් ආර්එම්ඩී රත්නායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයු පීඑස්සී තුමන්ගේ දැවැන්ත සංවර්ධන සැළැස්මේ එක් අංගයක් බවට පත්වෙමින් එය වැඩිදියුණු කර නවීකරනය කිරීමට කටයුතු සැළසිණි. ඉතා කෙටි කාලයකින් සංවර්ධන කටයුතු අවසන්ව නිමාවට පත් කෙරුනු මෙම විහාරස්ථානය මධ්‍යස්ථාන සේනාවිධායක තුමන්ගේ ගෞරවනීය ආරාධනයෙන් රෙජිමේන්තු අධිපතිතුමන්ගේ සුරතින් සම්බුද්ධ ප්‍රතිමා වහන්සේගේ සිරස නිරාවරණය කරනු ලැබීය. මෙම අවස්ථාවට මේජර් ජෙනරාල් ජේආර් කුලතුංග ආර්එස්පී එන්ඩීයු පීඑස්සී තුමන් සමගින් රෙජිමේන්තු මධ්‍යස්ථානයේ සියලුම නිලයින්ගේ සහභාගීත්වය සටහන් කෙරිණි.

සටහන
වයිට්හැකල් ප්‍රකාශන අංශය





# සත්ව ලෝකයෙන්

## කරමල් බෝදිලිමා/ගැටහොඹු කටුස්සා/බොහොඩා



ලංකාවට ආවේණික ඉතාම අලංකාර උරගයෙකි. වර්ණවත් විශාල උරගයෙක් වුවත් මෙම සත්වයාට පියවී ඇසට එකවර හඳුනා ගත නොහැකි ලෙසට හොඳින් අනුවර්තනය වී ඇත. ලංකාවේ පහත රට තෙත් කලාපයේ සිට මධ්‍යම කඳුකරය දක්වා පුළුල් ව්‍යාප්තියක් පෙන්වයි. තම ශරීර වර්ණයන් ඉතා ඉක්මණින් වෙනස් කර ගැනීමට හැක. විද්‍යාත්මක නාමය Lyriocephalus scutatus වන අතර, ඉංග්‍රීසි භාෂාවෙන් Hump-nosed Lizard ලෙසද මොවුන් හැඳින්වේ. මොවුන් හට ගැට හොඹු කටුස්සා යන නාමය ලැබී ඇත්තේ මෙම සතුන්ගේ නාසය ඉදිරියේ ගෝලාකාර ගැටයක් පෙනෙන්නට තිබෙන බැවිනි. ලංකාවට ආවේණික වුවත් අද වන විට සුරතල් ලෙස ජර්මනිය වැනි රටවල ලංකාවෙන් අනවසරයෙන් අපනයනය කල සතුන් සිටිනා බවට වාර්තා ලැබී ඇත. විශාලත්වයෙන් මිලිමීටර් 200 - 300 පමණ වන අතර, ගැහැනු සතා ඊට වඩා කුඩා වේ. බිත්තර මගින් බෝ වන අතර වරකට බිත්තර 1 - 16 ප්‍රමාණයක් දමයි. විශාල ඇස් තිබීම හා මුඛය තුල තියුණු රතු පැහැ ගැනීම නිසා මිනිසුන් මෙම සත්වයාට බියක් දක්වන අතර, මෙම සත්වයා සම්පූර්ණයෙන්ම මිනිසුන්ට හානිදායක නොවේ. අද වන විට වාසස්ථාන අහිමිවීම හා අනවසර අපනයනය හේතුවෙන් ලංකාවෙන් වඳවීමේ තර්ජනයට මෙම උරගයා මුහුණු දී ඇත.

## වත රතු මල් කොහා



පහත රට කඳුකරයේත්, වනන්තරවලත් වාසය කරන දුලභ පක්ෂියෙක් වන වත රතු මල් කොහා වර්තමානයේ ශ්‍රී ලංකාවට අවේනික පක්ෂියෙක් ලෙස සැලකේ. මෙම පක්ෂියා දකුණු ඉන්දියාවේ වාර්තා වී ඇති නමුත් දැන් එහි නෂ්ටව ගොස් ඇත. දිගින් සාමාන්‍ය ඇටි කුකුළෙකු තරම් වේ. නමුත් ශරීරය වඩා සිහින්ය. පෙඳය වඩා දිගුය. මොහුගේ රතු පැහැති මුහුණ මත සියුම් කෙඳි වැනි පිහාටු දක්නට ලැබේ. හොටය ලා කොළ පැහැතිය. උදරය සුදු පැහැ වන අතර, ලය කළු පැහැතිය. තනිව ජෝඩු වශයෙන් හෝ කුඩා රංචු වශයෙන් වාසය කරන මල් කොහා තුරු වියනෙහි වෙසෙන ක්‍රියාශීලී පක්ෂියෙකි. එහෙත් පියාපත් කෙටි හා රවුම් ඒවා වන නිසා මොහු දුර්වල පියාසරකරුවෙකි. සාමාන්‍යයෙන් නිහඬ පක්ෂියෙකි. කැලෑ ගස්වල හටගන්නා කුඩා ඵල වර්ග මොහුගේ ආහාරය වේ. වසරේ මුල් භාගයේ අභිජනනය කරන වත රතු මල් කොහාගේ කැදැල්ල වනාන්තරයේ උස් පඳුරක තනා ඇති නොගැඹුරු පීරිසි හැඩයේ එකකි. තණ කොළ මුල් සහ අතු කැබලි වලින් මෙය තනනු ලැබේ.

අන්තර්ජාලය ඇසුරෙන්
වයිට් හැකල් ප්‍රකාශන අංශය

## දැනුමෙන් පුහුණුවෙන් පෙරට යන
## නි/66312 මේජර් එස්එන් හල්වතුර අර්ර්එස්පි ශ්‍රීලපාහ



2004.11.07 වන දින කෙඩෙට් නිළධාරියෙකු ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට බැදි මුලික කෙඩෙට් පාඨමාලාව කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයෙන් හදාරා දෙවන ලුතිතන් වරයෙකු ලෙස ශ්‍රීලංකා පාබල හමුදාවට එක් වන මෙම නිළධාරි 2015 මැයි මස 26 වන දින සිට ජුනි මස 01 වන දින දක්වා කාලය තුල පැවති සංග්‍රාමික වෙඩිතැබීමේ තරගාවලිය සදහා සහභාගි විය. එම තරගාවලියේ කපිතාන් නිළයේ විවෘත අංශයේ ප්‍රථම ස්ථානයද, විවෘත අංශයේ සියලු වෙඩික්කරුවන් අතර දෙවන ස්ථානයද, කපිතන් නිලයේ ආධුණික අංශයේ ප්‍රථම ස්ථානය ද විවෘත ආධුණික අංශ දෙකෙන් සියලු වෙඩික්කරුවන් අතර දෙවන ස්ථානය ද ලබා තරගාවලියේ ජයග්‍රහනය ලබාගන්නා ලදි. දිනෙන් දින දක්ෂතා පෙන්වමින් ඉදිරියට යන මෙම නිලධාරි හට 11 ශ්‍රීලපාහ ඒකක අණදෙන නිලධාරි තුමන් ඇතුලු සියලුම නිලයින්ගේ උණුසුම් සුභ පැතුම් පුද කරමු.

බුද්ධි අංශය 11 ශ්‍රීලපාහ

# 12 ශ්‍රීලපාහ 8 වන සංවත්සරය සමරයි







ඒකකය ආරම්භ කර 2015.12.03 දිනට වසර 8ක් පිරීම නිමිත්තෙන් ඒකක අණදෙන නිලධාරී වන ලුතිතන් කර්නල් ඩිඑස්එස් රදලගේ ආර්ඩබ්පී ආර්එස්පී ශ්‍රීලපාහ යන ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ පූර්ණ මග පෙන්වීම යටතේ  ආගම දහමට මුල් තැන දෙමින් බළඇණි දිනය සැමරීමට සියලු කටයුතු සුදානම් කරන ලදි.

2015.12.02 දින මුලතිව් වට්ටප්පලේයි අම්මාන් කෝවිලෙහි විශේෂ දේව මෙහෙයක් සිදු කල අතර, 2015.12.03 දින ඒකක අණදෙන නිලධාරී තුමා හට සම්මාන මුරයක් පිරිනමා ඒකක ධජය ඔසවා, රෙජිමේන්තු ගීතය ගැයීමෙන් අනතුරුව අණදෙන නිලධාරී තුමා හට පිරිස් අමතන ලදි.

මෙයට සමගාමීව නිලධාරීන් හා සෙසු නිලයන් 91 දෙනෙකුගේ සහභාගිත්වයෙන් යුතුව ලේ දන්දීමේ කඳවුරක් එදින පවත්වන ලදී. මෙම ඒකකයේ ඇරයුමකට අනුව ලේ දන්දීම සඳහා සහෝදර බළඇණියක් වන 4 ශ්‍රීලපාහ ඒකකය වෙතින්ද නිලධාරියෙක් සහ සෙසුනිලයින් 10 කින් යුත් භට පිරිස් ප්‍රමාණයක් සහභාගී වන ලදී. වැඩසටහන් මාලාවේ සුවිශේෂී වැඩසටහනක් ලෙස 2015.12.04 දින ඓතිහාසික අනුරාධපුර ජයශ්‍රී මහා බෝධීන් වහන්සේ අභියස බෝධි පූජාමය පිංකමක් පවත්වන ලදී.

2015.12.05 දින ඒකකයේ සියලුම නිලයින්ගේ සහභාගීත්වයෙන්  යුතුව සුහද හමුව හා රාත්‍රී සංගීත සැදෑව '' බියුගල්ස් ''  සංගිත කණ්ඩායම මියුරුසර සමග අණදෙන නිලධාරී තුමාගේ ප්‍රදානත්වයෙන් වර්ණවත් වූ අතර, ජා ඇල 'නිශා විත් ෂා ඩාන්සස් '  නර්ථනයෙන් එක්විය.

# 12 ට නව කොනොනි සමාජ ශාලාවක්

ඒකකයට ඉමහත් අඩුපාඩුවක්ව පැවති කොනොනි සමාජ ශාලාවක අවශ්‍යතාවය අණදෙන නිලධාරීතුමන්ගේ සංකල්පයක් මත මුලතිව් නන්දිකඩාල් කලපු තීරයට මුහුණලා ඉතා මනරම් පරිසරයක ඉදිකිරීමට කටයුතු කරන ලදි. ඉතා කෙටි කාලයක් තුල සිදුකරන ලද ඉදිකිරීම් කටයුතු හමාර වීමෙන් පසු, 2015.12.03 දින 0922 පැයට යෙදුණු සුබ මොහොතින් අණදෙන නිලධාරී තුමන්ගේ සුරතින් විවෘත  කරන ලදි.







JOURNAL OF THE SRI LANKA LIGHT INFANTRY
The WHITE HACKLE 86 ISSUE OCT - DEC
ශ්‍රී ලංකා පාබල හමුදා සඟරාව | වයිට් හැකල්

# ඉන්දු ශ්‍රී ලංකා මිත්‍ර ශක්ති යුද අභ්‍යාසයේ
# දස්කම් පෙන්වූ කෝප්‍රල් විජේවර්ධන



2015 ඉංදු ශ්‍රී ලංකා මිත්‍ර ශක්ති යුධ අභ්‍යාස පසුගියදා ඉන්දියාවේ පුනේ ප්‍රදේශයේ යුධ හමුදා පුහුණු පාසලේදී සාර්ථකව නිමාවට පත්වූ අතර, ඒ සදහා 15 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව නියෝජනය කරමින් සෙනීන් 04 දෙනෙකු සහභාගි විය. එම අභ්‍යාසය තුලදී දෙරටේ යුධ හමුදා නිලයන් අතර සහයෝගීතාවය මෙන්ම විවිධ දක්ෂතා හා හැකියාවන් උරගා බලනු ලැබිණි. එම යුද අභ්‍යාසයේ සුවිශේෂී අභ්‍යාසයක් වන යුධ බාධක තරණය සදහා ශ්‍රී ලංකා සහ ඉන්දියානු සොල්දාදුවන් අතර දැඩි තරඟකාරීත්වයක් තිබිණි.

මෙම ඉසව්ව සඳහා දෙරටම නියෝජනයකරමින් සෙබලුන් 08 දෙනා බැගින් කණ්ඩායම් 08ක් සහභාගි වූ අතර එහි 06 වන කණ්ඩායමෙන් තරග වැදී බාධක 22 ක් විනාඩි 7.22 කින් තරණය කර පහසුවෙන් තරගය නිමාකර ශ්‍රී ලංකා කණ්ඩායමෙන් පළමු ස්ථානය ලබාගැනීමට මෙම ඒකකයට අයත් සෙ/317352 කෝප්‍රල් විජේවර්ධන ඩබ්පීටීඅයි (ආර්එස්පී) යන කොනොනි සමත් විය.

මෙම අභ්‍යාසයට සහභාගි වී ශ්‍රී ලංකා පාබල හමුදාවේ මෙන්ම සමස්ථ යුධ හමුදාවේම ශක්තිය හා ගෞරවය ආරක්ෂා කරන ලද මෙම කොනොනි හට තව තවත් මෙවැනි ජයග්‍රහණ ලබා පාබල හමුදාවේ ශක්තිය තුලින් සමස්ථ යුධ හමුදාවටම කීර්තියක් ගෙන දීමට ශක්තිය ධෛර්ය ලැබේවායි 15 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරී තුමා ඇතුළු සියළුම නිලයින් විසින් ප්‍රාර්ථනා කරන්නෙමු.




# ලාකෝ ඒකනායක
# මෙවර දකුණු ආසියානු
# (SAARC) ක්‍රීඩා උළෙලට

| තරගාවලිය | දක්ෂතාවය |
|---|---|
| 2013 වයඹ පළාත් ටයිකොන්ඩෝ තරඟාවලිය | ලෝකඩ පදක්කම |
| 2013 අන්තර් රෙජිමේන්තු ටයිකොන්ඩෝ තරඟාවලිය | රන් පදක්කම |
| 2014 වයඹ පළාත් ටයිකොන්ඩෝ තරඟාවලිය | රන් පදක්කම |
| 2014 ජාතික මහා ක්‍රීඩා උළෙල | රිදී පදක්කම |
| 2015 වයඹ පළාත් ටයිකොන්ඩෝ තරඟාවලිය | රන් පදක්කම |
| 2015 ශ්‍රී ලංකා කොරියානු ජාතික කුසලාන තරගාවලියේ කුංෆු ඉසව්ව | ලෝකඩ පදක්කම |

15 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවට අයත් දැනට ශ්‍රී ලංකා යුධ හමුදා ටයිකොන්ඩෝ සංචිතයේ පුහුණුවීම් කරනු ලබන සෙ/328359 ලාකෝ ඒකනායක ඊඑම්ටීඑන් යන කොනොනි මේ දක්වා ශ්‍රී ලංකා යුධ හමුදා ටයිකොන්ඩෝ සංචිතය නියෝජනය කරමින් පාබල හමුදාවටත්, සමස්ථ යුධ හමුදාවට මෙන්ම මුළු මහත් දිවයිනටම කීර්තියක් අත්කර දීමට කැපවීමෙන් කටයුතු කරමින් තම ක්‍රීඩා දක්ෂතාවය වැඩිදියුණු කරගනිමින් සිටී. 2016 වර්ෂයේ දී පැවැත්වීමට නියමිත දකුණු ආසියාතික ක්‍රිඩා උළෙල (SAARC) සදහා ශ්‍රී ලංකාව නියෝජනය කරන ටයිකොන්ඩෝ සංචිතයට ශ්‍රී ලංකා පාබල හමුදාවේ එකම නියෝජනය වශයෙන් තේරී පත්වීමට තරම් දක්ෂතාවය හා වාසනාව උරුම කරගෙන ඇති මෙම කොනොනි හට එම තරගාවලියේදී ලක් මෑණියන් රණින් බබළවා පාබල හමුදාවට මෙන්ම සමස්ථ යුධ හමුදාවටම ඉමහත් ගෞරවයක් ලබාදීමට ශක්තිය ධෛර්ය ලැබේවායි 15 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරී තුමා ඇතුළු සියළුම නිලයින් විසින් ප්‍රාර්ථනා කරන්නෙමු.

බුද්ධි අංශය 15 ශ්‍රීලපාහ

# උපන්දින සුභ පැතුම්



2015 සැප්තැම්බර් මස 10 වන දින
හතරවැනි උපන්දිනය සැමරූ
16 ශ්‍රීලපාහ සෙ/16ඩී00311 කෝප්‍රල්
කරුණාරත්න EGJAS ගේ
ආදරණීය දියණියන්
ශිහානි නිම්සරා / ගිම්හානි සත්සරණි



2015 නොවැම්බර් මස 02 වන දින
දෙවැනි උපන්දිනය සැමරූ
7 ශ්‍රීලපාහ සෙ/322669 කෝප්‍රල්
සිල්වා ASK ගේ
ආදරණීය පුත් සිත්ඩින ඉල්සාර



2015 දෙසැම්බර් මස 27 වන දින
තුන්වැනි උපන්දිනය සැමරූ
7 ශ්‍රීලපාහ
සෙ/323996 ලාකෝ මද්දුම බණ්ඩාර HAT ගේ
ආදරණීය පුත් තනුජන සංකේත්



2015 අගෝස්තු මස 03 වන දින
හතරවැනි උපන්දිනය සැමරූ
10 ශ්‍රීලපාහ සෙ/324039 කෝප්‍රල්
ජීවරත්න HK ගේ ආදරණීය දියණිය
ප්‍රතිභා බුද්ධිනි



2015 නොවැම්බර් මස 11 වන දින
පළමුවන උපන්දිනය සැමරූ
15 ශ්‍රීලපාහ සෙ/316458 කෝප්‍රල්
චන්ද්‍රසිරි SDN ගේ ආදරණීය දියණිය
අමන්දි නිකේෂා



2015 ඔක්තෝබර් මස 13 වන දින
දෙවන උපන්දිනය සැමරූ
15 ශ්‍රීලපාහ සෙ/321924 කෝප්‍රල්
වීරවර්ධන DVDS ගේ ආදරණීය දියණිය
ගිහංසා නෙතුපිණි



2015 දෙසැම්බර් මස 11 වන දින
තෙවැනි උපන්දිනය සැමරූ
15 ශ්‍රීලපාහ සෙ/331300 ලාකෝ
ජනප්‍රිය AGC ගේ ආදරණීය දියණිය
තිසරි ප්‍රාර්ථනා



2015 නොවැම්බර් මස 20 වන දින
පස්වැනි උපන්දිනය සැමරූ
15 ශ්‍රීලපාහ සෙ/315994 සැරයන්
සේරසිංහ UAAB ගේ ආදරණීය දියණිය
හිරුකි සේමින්දි



2015 ඔක්තෝබර් මස 11 වන දින
පළමු උපන්දිනය සැමරූ
23 ශ්‍රීලපාහ සෙ/328664 ලාකෝ බණ්ඩාර
KBSS ගේ ආදරණීය දියණිය
නිහංසා දිව්‍යාංජලි



2015 දෙසැම්බර් මස 03 වන දින
12 වන උපන්දිනය සැමරූ
19 ශ්‍රීලපාහ සෙ/316967 සැරයන්
අබේවික්‍රම PDIN (RSP) ගේ ආදරණීය දියණිය
දේශානි සංදීපා



2015 නොවැම්බර් මස 18 වන දින
දෙවැනි උපන්දිනය සැමරූ
19 ශ්‍රීලපාහ සෙ/313454 කෝප්‍රල්
පෙරේරා WRK ගේ ආදරණීය පුතණුවන්
ඉන්සර රොනාල



2015 ඔක්තෝබර් මස 20 වන දින
හතරවන උපන්දිනය සැමරූ
15 ශ්‍රීලපාහ සෙ/317286 කෝප්‍රල්
ද සිල්වා SSSK ගේ ආදරණීය පුතණුවන්
තෙනුප සෙව්පිත



2015 දෙසැම්බර් මස 15,30 වන දිනයන්වල
උපන්දින සැමරූ 23 ශ්‍රීලපාහ
සෙ/320631 කෝප්‍රල් රත්නායක MRMSK ගේ
ආදරණීය පුතණුවන් දෙදෙනා
විමේෂ් තීක්ෂණ / ඔෂද නවින්



2015 දෙසැම්බර් මස 25 වන දින
තෙවන උපන්දිනය සැමරූ
23 ශ්‍රීලපාහ සෙ/328698 සාසෙ
විජේසිංහ WACR ගේ
ආදරණීය දියණිය අකිලා උමන්දි



2015 සැප්තැම්බර් මස 27 වන දින
සත්වන උපන්දිනය සැමරූ
සෙ/2ඩී02795 කෝප්‍රල් වීරසිංහ ADSK ගේ
ආදරණීය පුතණුවන්
චමෝත් මදුංසක



2015 නොවැම්බර් මස 09 වන දින
සයවන උපන්දිනය සැමරූ 17 ශ්‍රීලපාහ
සෙ/17ඩී00332 ලාකෝ අත්තනායක
AMSAK ගේ ආදරණීය දියණිය
සචිනි උපේක්ෂා



2015 නොවැම්බර් මස 18 වන දින
තුන්වන උපන්දිනය සැමරූ 12 ශ්‍රීලපාහ
සෙ/309317 සාසෙ කිත්සිරි KMU ගේ
ආදරණීය දියණිය ජනුත්මි තරින්සා



2015 ඔක්තෝබර් මස 17 වන දින
හතරවන උපන්දිනය සැමරූ
12 ශ්‍රීලපාහ සෙ/311974
සැරයන් අජිත් කුමාර AGN ගේ
ආදරණීය දියණිය සිතුමිණි සිහනාසා



2015 සැප්තැම්බර් මස 09 වන දින
දෙවන උපන්දිනය සැමරූ
12 ශ්‍රීලපාහ සෙ/311974
සැරයන් අජිත් කුමාර AGN ගේ
ආදරණීය දියණිය රුවන්ජානා සත්සරණි



2015 දෙසැම්බර් මස 20 වන දින
තුන්වන උපන්දිනය සැමරූ සෙ/2ඩී02795
කෝප්‍රල් වීරසිංහ ADSK ගේ
ආදරණීය දියණිය සචිනිකා නිමාෂි



# දසුනේ හසුන

සැමදා පැතුවේ නිවහල් ජාතියක් පුතා
සමුගෙන ගියේ යලි නොඑනට දෙනෙත් පියා
සෙනෙහස හිමිය හැමදාමත් නුඹට සදා
යලි හමුවේවි මතු සසරේදී මගේ පුතා

දසුන/හසුන : කෝප්‍රල් මහින්දසේන AGMR
වයිට්හැකල් ප්‍රකාශන අංශය

# මංගල සීනු



වාසනාවන්...
සුබ මංගලම්.



15 ශ්‍රීලපාහ සෙ/325589
කෝප්‍රල් සමරනායක NWPC
2015 මැයි මස 28 වන දින
සුබෝධා නිල්මිණි මෙනවිය සමග
යුගදිවියට පා තබන ලදී



15 ශ්‍රීලපාහ නි/69137
ලුතිතන් BGMKJ වීරරත්න ශ්‍රීලපාහ
2015 සැප්තැම්බර් මස 07 වන දින
නිමන්තිකා සඳමාලි මෙනවිය සමග
යුගදිවියට පා තබන ලදී



# Life Membership of SLESA - 2015

## සේවා මුක්ත භට සංගමය මගින් පාබල හමුදා සංගමයේ ජ්‍යෙෂ්ඨ නිලධාරින් සහ සාමාජික මහතුන් හට යාව ජීව සාමාජිකත්වට පිරිණැම්ම

සේවා මුක්ත භට සංගමයේ මුලාශ්‍ර අනුව සේවා මුක්ත භට සංගමය යනු 1944 වසරේ දී ආරම්භ කරන ලද විශ්‍රාමික ත්‍රිවිධ හමුදා සාමාජිකයින් ගෙන් සැදුම් ලත් සුභ සාධක ආයතනයකි. එය පාර්ලිමේන්තු පනතක් මගින් අනුමැතිය ලත් අයතනයකි. එදා මෙදා තුර එහි අනුශාසක තනතුරු දරන්නේ ශ්‍රී ලංකා රාජ්‍ය නායකයා වන අතර, උප අනුශාසක තනතුරු 03ක් ත්‍රිවිධ හමුදා ආඥාපති වරුන්ට නිරායාසයෙන්ම අත්පත් වේ. අද වන විට උප සංගම් 42කින් සමන්විත වන අතර, 1945 වසරේදි ආරම්භ කරන ලද පාබල හමුදා සංගමය එහි පස්වන සාමාජිකයා බවට පත්ව ඇත.

සේවා මුක්ත භට සංගමය සහ උප සංගම් වල පැවැත්ම අඛණ්ඩව චිරාත් කාලයක් පවත්වාගෙන යාමට සාමාජික සුබසාධන කටයුතු එනම්, ශෛල්‍යකර්ම වලට, මුදල් ගෙවිම රෝගී තත්වයන්ට රජයේ රෝහල් වල නොමැති බෙහෙත් පිටතින් ලබාගත් බිල්පත් යම් ප්‍රමාණයකට නිරවුල් කර දීම. ඇස් කණ්නාඩි ලබාගැනිමට රුඃ 3000/ක් ලබා දිම. රජයේ විශ්ව විද්‍යාලවල ඉගෙනුම ලබන සාමාජික දුවා දරුවන් වෙනුවෙන් ශිෂ්‍යත්ව පිරිනැම්ම. කටාන බෝලගල වැඩිහිටි විශ්‍රාම ශාලාවක් පවත්වාගෙන යාම ලෝක යුධ විරුවන්ට (ශ්‍රී ලාංකික) ආධාර මුදල් සහ එම බිරින්දෑ වරුන්ටද සුළු දිමනාවක් මේ දක්වා ගෙවිම් කටයුතු කිරිම. සෑම වසරකම ඔක්තෝබර් මස කොළඹ විහාර මහදෙවි උද්‍යානයට යාබදව ඇති යුධ ස්මාරකය අසල මල්වඩම් තැන්පත් කර ලෝක යුධ විරුවන් සහ දේශිය ත්‍රිවිධ හමුදා රණවිරුවන් සිහිපත් කර ගෞරවය පුද කිරිම යන ක්‍රියාදාමයන් ඉටුකරන්නේය.

එම කාර්යයන් ඉටු කිරිමට එම සංගමයේ විවිධ නිලතල දරමින් සහයෝගය දක්වන දායකත්වයක් දක්වන කැපවිමෙන් ක්‍රියා කරන උප සංගම්වල සාමාජික මහතුන් වෙත ගෞරවයත්, අභිමානයත්, පිරිනමමින් යාව ජීව සාමාජිකත්වය (Life Membership) පිරිනැම්ම සිදු කරේ.

ඒ අනුව අප සංගමය ද සාමාජික මහතුන් එම ගෞරය සම්මානයෙන් පිදුම් ලැබුවේ නම් සංගමයට ද පාබල හමුදා රෙජිමේන්තුවටද විශාල ගෞරවයක්, අභිමානයක් අත්පත් වන්නේය. මෙම ගෞරවය අභිමානය හැම සාමාජික මහතෙකුට ලබා ගැනිම අතිශය දුෂ්කරය. ඒ සඳහා විශාල කැප කිරිමක් සිදු කළ යුතු වේ. තම සංගම් වල මෙන්ම මව් සංගමයේ අඛණ්ඩව වර්ෂ 10 ක් ම කළමණාකරණ මණ්ඩල සහ සේමුබ සංගමයේ (EXCO) මාසික රැස්විම් වලට සහභාගි යුතු විමත් ඊට අමතරව එහි උප සංගම්වල වර්ෂ 05 කට නොඅඩුව කාල සිමාවක් සේවය කර තිබිම අත්‍යාවශ්‍ය වේ. 2015 වසරේ සිට අඛණ්ඩව තිබු වර්ෂ 10 කඩින් කඩ යනුවෙන් නීතිරිති සංශෝධනය විම එම ගෞරවය ලැබිමට සරල භාවයක් පෙන්නුම් කරන බැවි සියලු සාමාජික මහතුන්ගේ දැන ගැනිමට සටහන් තබමු.

### මින් පෙර ගෞරවය සම්මානයෙන් පිදුම් ලැබ ඇති ජ්‍යෙෂ්ඨ නිලධාරින් සෙසු නිලයන්

- **ලුතිතන් ජෙනරාල් එච්වි අතුකෝරල වීඑස්වී පීඑස්සී එෆ්බීඅයිඑම්**
- **මේජර් ජෙනරාල් ඒඑම්යු සෙනවිරත්න ආර්එස්පී වීඑස්වී එන්ඩීසී**
- **කපිතන් ජේඑල්සී ප්‍රනාන්දු**
- **කපිතන් ජේඑස් බණ්ඩාර**
- **කෝප්‍රල් ජෝකිම් ඒජේ**

# විශ්‍රාමික සේවයේ දී දක්වන ලද කුසලතාවයන්ගේ ගුණාත්මක භාවය නිසාම 2015 වසරේ දී පහත නම් සඳහන් තිදෙනා ද ගෞරව සම්මානයෙන් පිදුම් ලැබුහ.



## සෙ/104643 බනි 11 සිල්වා එම්ඩී

යුද්ධ හමුදාවට බැදුණු දිනය 1962.11.27

විශ්‍රාම ගිය දිනය 1986.04.26

සාමාජික අංකය 2756

- ඕමාන් රාජකීය නාවික හමුදාවේ සේවය කර තිබීම
- අප සංගමය මෙන්ම මව් සංගමයේ ද සේවය කිරීම 2000 වසරේ සිට මේ දක්වා වර්ෂ 16කි
- වසර 2ක කිලයක් සංගමයේ උප භාණ්ඩාගාරික තනතුර දැරීම
- 2013 සිට මේ දක්වා සේමුහ හි නීති සම්පාදන මණ්ඩලයේ සාමාජිකත්වය දැරීම.
- පොපි සැමරුම් උත්සව වලට සහභාගි විම



## සෙ/107558 ව/සැරයන් ටියුඩර් වීපී

යුද්ධ හමුදාවට බැදුණු දිනය1965.10.04

විශ්‍රාම ගිය දිනය1987.10.05

සාමාජික අංකය 2659

- අප සංගමය මෙන්ම මව් සංගමයේ ද නියෝජනය 1995 සිට 2014 දක්වා 2009 වසර පමණක් හැර එනම් වසර 19 ක් සේවය කර තිබිම.
- පාබල හමුදා සංගමයේ වර්ෂ 02ක් උප ලේඛම් ධුරයේ සේවය කිරිම.
- සේමුහ විශ්‍රාම වැටුප් විශමතා කමිටුවේ සාමාජිකයෙකු ලෙස සේවය කිරීම (1997 සිට 2003 දක්වා)
- සේමුහ හි සුභසාධක කමිටුවේ 2004 සිට 2007 දක්වා සාමාජිකත්වය දැරිම.
- 2014 වසරේ නැවත සුභ සාධක කමිටුවේ සාමාජිකත්වය දැරිම.
- 2014 පොපි පාගමනට සහභාගි විම.
- පොපි සැමරුම් උත්සව වලට සහභාගි විම.

2014 වසරේදි හදිසි අනතුරකට ලක්ව කකුලේ අබාදය නිසා එම වසරේ ප්‍රතිකාර ලබමින් නිවසේ රැදි සිටින අතර, ඔහුට ඉක්මන් නිරෝගි සුවය පාර්ථනා කරමු.



## සෙ/10602 ව/සැරයන් අල්විස් යූඩී

යුද්ධ හමුදාවට බැදුණු දිනය 1962.06.22

විශ්‍රාම ගිය දිනය 1984.04.21

සාමාජික අංකය 3802

- අප සංගමය මෙන්ම මව් සංගමයේ ද නියෝජනය 2002 වසරේ සිට අඛණ්ඩව මේ දක්වා වර්ෂ 14කි.
- බෝලගල වැඩිහිටි නිවාසයේ පරිපාලන උප කමිටුවේ සාමාජිකයෙකු ලෙස වර්ෂ 08ක් සේවය කර තිබිම.
- 2014 පොපි පාගමනට සහභාගි විම.
- පොපි සැමරුම් උත්සව වලට සහභාගි විම.

පාබල හමුදා සංගමයේ සේවය කරමින් සේවා මුක්ත භට සංගමය වෙනුවෙන් ද විනය ගරුකවත්, අවංකවත්, කැපවිමෙනුත්, අප්‍රතිහත ධෛර්යෙන් යුතුව සේවය කිරීම වෙනුවෙන් කරන ලද සේවාවන් හි ඇගයිමට ලක් කර ඔබ සැමට සේවා මුක්ත භට සංගමය වෙතින් ප්‍රධානය කරන ලද ඒ උත්තරීතර ගෞරව සම්මානය උදෙසා අප සැම ඔබට නිදුක් නිරෝගී දිර්ඝායුෂ ස්තූති පුර්වකව පිරිනමන්නෙමු.

සැකසුම :
කපිතන් ඩබ්ලිව්පේ සිරිවර්ධන යූඑස්පී (විශ්‍රාමික)



# මාසික වැටුපෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට ක්‍රම 5ක්

## සාමාන්‍ය වැටුප් පරිභෝජනය

ශ්‍රී ලංකාවේ සාමාන්‍යයෙන් පවුලක සැමියා මෙන්ම බිරියද බොහෝවිට රැකියාවල නිරත වෙයි. නමුත් නිවෙසේ මුදල් පරිහරණය සිදුවන්නේ බොහෝ විට කාන්තාව අතිනි. වැටුප අතට ගත් විගසම අප සිදු කරන්නේ පළමුව පෙර මාසයේ විදුලි හා ජල බිල් ගෙවීමට, දරුවන්ගේ පන්ති ගාස්තු හා ණය ගෙවීමට වෙන්කිරීමයි. මෙයට වැඩි මුදලක් වෙන් කිරීමටද සිදුවෙයි. දෙවනුව තම ආහාර පාන ගැන වැඩි අවධානයක් යොමු කරයි. කාන්තාවන් තෙවනුව වැඩි පිරිවැයක් වෙන් කරනුයේ විලාසිතාවලට හා තම තත්ත්වයට වඩා වැඩි දේ කිරීමට කරන උත්සාහයටයි. නවීන වාහනයක් මිලදී ගැනීම, වැනි වැඩි පීඩනයක් ඇතිවන පිරිවැයක් දැරීමට සිදු වන කටයුතුවලට මොවුන් නැඹුරුවක් දක්වයි. ණය නොවී සිටින ලෙස ස්ථිර ආයෝජන ක්‍රමයකට යම් මුදලක් වෙන් කිරීමයි. වෙනත් සුළු හෝ ව්‍යාපාරයකට මුදලක් වෙන් කිරීමට මොවුන් හුරුව ඇත. සරල ක්‍රමවේද පහක් තමාට හිමිවන මාසික වැටුප විවිධ වෘත්තීන් අනුව වෙනස් වුවත් එය නිසි ලෙස කළමනාකරණය කර ගැනීමට ඔබ දැන ගත යුතුයි. මේ නිසා මුදල් පරිභෝජනය කිරීමේදී මේ කාරණා ගැන සැලකිලිමත් වන්න

.

### වෛද්‍ය පර්යේෂණයක් 01

පවුලේ සියලූ දෙනාටම අංග සම්පූර්ණ වෛද්‍ය පරීක්ෂාවක් සිදු කිරීමට අවස්ථාවක් උදා කරගන්න. වෛද්‍ය පරීක්ෂාවකට වැඩි මුදලක් වැය වන නිසා ඔබ මෙවැනි දේ කල් දමනවා විය හැකියි. නමුත් ඔබේ නිරෝගිකම හොඳින්ම මැන බැලිය හැකි වන්නේ මෙවැනි වෛද්‍ය පරීක්ෂණයකිනි. මේ නිසා මුදල් අතට ලැබුණු විටෙක ඔබේ සෞඛ්‍යසම්පන්න බව පරීක්ෂා කර ඉදිරියේදී ඇති විය හැකි රෝග අවදානමින් මිදෙන්න. නමුත් අවුරුදු හා නත්තල් සමයේදී ඔබේ ආහාර රටාවේ තෙල්, සීනි වැඩි වන නිසා මේ කාලයේදී වෛද්‍ය පරීක්ෂණ සිදුකර නොගන්න.

### රක්ෂණාවරණයක් 02

පිළිගත් ආයතනයකින් වෛද්‍ය රක්ෂණාවරණයක් ලබා ගන්න. මේ සඳහා මාසික වැටුපෙන් රු. 2000ක් පමණ වෙන් වුවත් මෙය හදිසි අනතුරක් හෝ ශල්‍යකර්ම සිදු කිරීමට අවශ්‍ය වූවිට එය ආර්ථිකමය වශයෙන් විශාල වාසියකි. දරුවන්ටත් ගිණුමක් දරුවකු උපත ලැබූ පසු එම දරුවා වෙනුවෙන් ගිණුමක් ආරම්භ කරන්න. මවුපියන් මාසිකව ලබන වැටුපෙන් 2%ක් වත් ඔවුන් වෙනුවෙන් ඉතිරි කරන්න. මුදල් තැන්පතු ගිණුමක් මෙන්ම රක්ෂණ ගිණුමක් ආරම්භ කරන්න. දරුවාගේ හදිසි රෝගී තත්ත්වයකදී ඔබ අත මුදල් නැති වුවත් මෙවැනි රක්ෂණාවරණයක් ඇත්නම් බිය විය යුතු නැත.

අනෙක් පිට බලන්න ☞



## පෝෂදායී ආහාරවලට වැඩි ඉඩක් 03

මුදල් ලැබුණු විට විනෝදයට කෘතිම රසකාරක යෙදූ කෙටි කෑමවලට නොව තරමක් මිල අධික වුවද පෝෂ්‍යදායක එළවළු පලතුරු මිලදී ගන්න. පෝෂණවේදියකුගෙන් නිසි උපදෙස් ලබාගෙන පෝෂ්‍යය ආහාර පිළිබඳ දැනුවත් වෙන්න. දෙළුම්, ඩ්‍රැගන්ෆෘට් වැනි මිල අධික පෝෂ්‍යය පලතුරු වර්ග ඔබේ ආහාරයට එක් කරගන්න. රසවත් නිර්මාංස ආහාර වේලක රස විඳින්නටත් ඔබට පුළුවන්. මීට අමතරව නිතර ආහාර වේලට එක්කර නොගන්නා නැවුම් කිරි, මැංගුස්, ලාවුලු වැනි පළතුරු වර්ග, ග්‍රීන් ටී පාන හා බෙලි මල් පානවලට වැඩි ඉඩක් ලබා දෙන්න.

## අමතර දැනුමක් එකතු කර ගන්න 04

මාසිකව ලබන වැටුපෙන් සුළු මුදලක් හෝ සෑම මසකම වෙන්කර තබන්න. ඔබ කැමැති මල් වගාව, කේක් නිර්මාණ හෝ අත්කම් වැනි පාඨමාලාවකට සති අන්තයේ සහභාගි වන්න. එවැනි පාඨමාලාවකට සහභාගි වී එය ඔබේ අමතර ආදායම් මාර්ගයක් කර ගැනීමට ස්වයං රැකියාවකට එළැඹීමටද හැකියි.

## සමාජ සේවයට වෙන් කරන්න 05

අප අතට ලැබෙන මුදලින් යම් ප්‍රමාණයක් දානමය හෝ ආගමික දෙයකට සමාජ සේවා අරමුදලට වෙන් කිරීමටද අමතක නොකරන්න. තමාගේ පරිභෝජනයට පමණක් මුදල් වැය නොකර ආධ්‍යාත්මික කටයුතුවල යෙදීමටද යම් මුදලක් වෙන් කරන්න. මාසිකව යෙදෙන දානමය කටයුත්තකට, දුගී දරුවන්ට වැනි සත්කාරවලටද පවුලම එක් අරමුදලක් සාදා එයට එක් කිරීමට හුරුවන්න. දරුවන් තුළ යහපත් ආකල්ප වර්ධනය කිරීමටද මෙවැනි කාර්යයන්වල යෙදීම පහසුවකි.

අන්තර්ජාලය ඇසුරෙන්
වයිට් හැකල් ප්‍රකාශන අංශය

# අරුත් නිරුත්




### අරුමැක්කේ

'අරුමැක්කේ' වුයේ
'අරුමයක් සේ' යන්නෙනි.
අරුමයක් සේ වු කලී
'පුදුමයක් සේ' ය.

යමකුට තවෙකකු ඉතා දීර්ඝ කාලයකට පසු දකින්නට ලැබුණු විට 'අරුමැක්කේ' යි කියැවේ. එසේ කියන කීමෙහි පුදුමයක් ද ගැබ් වී ඇත.

### අන්/ඉන්

අකාරාන්ත හෙවත් 'අ' ශබ්දයෙන් අවසන් වන 'සිංහල' 'යද්ෂ' යන ආදී වදන් අනුක්ත රූප ගන්නා විට, අන් ඉන් යන ප්‍රත්‍යය දෙකෙන් නිවැරැදි වන්නේ 'අන්' ප්‍රත්‍යයි. 'ඉන්' ප්‍රත්‍යය යොදනු වැරැදියි.

මෙ නයින් 'සිංහලයින් යක්ෂයින්, පුරුෂයින්, ශිෂ්‍යයින්, සේවකයින්' යන ආදී යෙදුම් සාවද්‍ය වේ.

ඒවා නිවැරැදි වන්නේ 'සිංහලයන්, යක්ෂයන්, පුරුෂයන්, ශිෂ්‍යයන්, සේවකයන්' යන ආදී වශයෙනි.

### අනවශ්‍ය 'ය' යන්නක්

අවශ්‍යතාවය යන නිවැරැදි වචනයට අනවශ්‍ය 'ය' කාරයක් යොදා අවශ්‍යතාවය යනුවෙන් ලියන උදවිය බොහෝයි. සංස්කෘත ශබ්දයක් සිංහල වචනයක් කැර ගැනීමේ දී අනුගමනය කළ යුතු නීතියක් ඇත. ඒ නීතිය මෙසේ යි. 'ආ' යන්නෙන් හෝ 'උ' යන්නෙන් අවසන් වන ශබ්දයකට 'ව' යන්න එක් කැර ගනීමත් 'අ' යන්නෙන් හෝ 'ඉ' යන්නෙන් අවසන් වන ශබ්දයකට 'ය' යන්න එක් කැර ගැනීමක් කළ යුතු ය. යන නීතිය අනුව හැදුණු වචන කීපයක් මෙසේ යි.

(ආ) අවශ්‍යතා+ව
= අවශ්‍යතාව
ප්‍රාර්ථනා+ව = ප්‍රාර්තනාව

(උ) වස්තු+ව = වස්තුව
අංශු+ව = අංශුව

(අ) ස්වප්න+ය = ස්වප්නය
විශ්වාස+ය = විශ්වාසය

(ඉ) බුද්ධි+ය = බුද්ධිය
මුෂ්ටි+ය = මුෂ්ටිය

**ඩීඑෆ් කාරියකරවන මහතාගේ "අරුත් නිරුත්" පොත ඇසුරින්**
**සැකසුම ලාකෝ රත්නකුමාර DKNN - ප්‍රකාශන අංශය**

## 19 ශ්‍රීලපාහ

# 7 වන වියට පා තබයි




සිය 7 වන සංවත්සරය සමරන 19 ශ්‍රීලපාහ මුලස්ථාන කඳවුරේ පිහිටි බුදු මැදුර අභියස විශේෂ පිංකමක් පැවැත්වූ අතර, මුලංකාවිල් පුල්ලෙයාර් කෝවිලේදී ඒකක ධජයට සහ අණදෙන නිලධාරීතුමා ඇතුළු සියලු නිලයින්ට සෙත් පතා දේව මෙහෙයක් පවත්වන ලදි. ඒකකය දැනට පවතින රාජකාරිමය තත්වය මත හා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ පැවති වර්ණ ප්‍රධානෝත්සවය හේතුවෙන් 2015.10.23 වන දිනට යෙදී තිබූ හත් වන වන බළඇණි දින සැමරුම 2015.11.04 සහ 06 යන දෙදින තුලදී ඉතා උත්කර්ෂවත් අන්දමින් සමරන ලදි.

2015.11.04 වන දින ක්‍රිකට් සහ අත්පන්දු ක්‍රීඩා ඉසව්වන්ගෙන් සැදුන්ලත් තරඟාවලියක් සියළු කණ්ඩායම් අතර පවත්වන ලදි. එහිදී අත්පන්දු සියළු කණ්ඩායම් අභිබවා අණ හා පාලන කණ්ඩායම ජයගත් අතර, ක්‍රිකට් තරඟාවලියේද ශූරයෝ වූයේ අණ සහ පාලන කණ්ඩායමයි. ඒකකයේ අණදෙන නිලධාරී නි/62675 ලුතිතන් කර්නල් ටීඑම්එස්ජේ තෙන්නකෝන් ආර්එස්පී ශ්‍රීලපාහගේ ප්‍රධානත්වයෙන් 2015.11.04 වන දින සවස් භාගයේ සියළුම සෙසුනිලයින් හට සාදයක් පැවත්වූ අතර, රෙම ඉසේරෙ අඩි රිද්ම සංගීත කණ්ඩායම ගෙන්වා එම සාදය සංගීත රසාස්වාදයෙන් වර්ණවත් කරන ලදි. බළඇණි සංවත්සර දිනයට සමාගාමීව ඒකකයේ බළලත් නිලධාරී හා සැරයන් නිවස්නයේ සුහද හමුවක් පැවැත්වූ අතර මේ සඳහා අණදෙන නිලධාරීන් ප්‍රමුඛ බලප්‍රදේශයේ ස්ථාපිත යුධ/නාවික හමුදා කඳවුරු වල රෙජිමේන්තු සැරයන් මේජර් වරුන් ද මේ සඳහා සහභාගී වූහ.

# ඉන්දියාව සහ ශ්‍රීලංකාව අතර පැවැති මිත්‍ර ශක්ති යුධ අභ්‍යාසය සදහා සහභාගිවූ 19 ශ්‍රීලපාහ රණවිරුවෝ

මානුෂිය මෙහෙයුම නිමාවත් සමගම ශ්‍රී ලංකා යුධ හමුදාව ලෝකයේ දක්ෂ සහ විශිෂ්ඨ හමුදාවක් වශයෙන් ජාත්‍යන්තරය පිලිගැනිමත් සමගම මිත්‍ර රටක් වන ඉන්දියාව ශ්‍රීලංකාවත් සමග මිත්‍ර ශක්ති යුධ අභ්‍යාසය දෙරට අතර පැවැත්විමට තිරණය කර ඒ සදහා ප්‍රථමයෙන් දෙරටේ කමාන්ඩෝ සහ විශේෂ බළකා භටපිරිස් සහභාගි කර ආරම්භ කරන ලදි. 2015 මිත්‍ර ශක්ති යුධ අභ්‍යාසය සදහා පාබල හමුදාව සහභාගි කරවිමේදි ප්‍රථමයෙන් අවස්ථාව හිමිවුයේ ශ්‍රීලංකා පාබල හමුදාවටයි.

ශ්‍රීලංකා පාබල හමුදාවේ රාජකාරි කරන සියලු ඒකකවල භටපිරිස් අතරින් තෝරාගත් 45 දෙනා අතරට 19 වන බළඇණිය ශ්‍රීලංකා පාබල හමුදාවේ සෙ/309330 බනි 1 ඒඒ අනුර කුමාර, සෙ/311746 ව/සැරයන් විජෙරත්න එච්එම්. සෙ/321024 කෝප්‍රල් මදුසංඛ ඩීඒඑස්, සෙ/323175 කෝප්‍රල් කොතලාවල බීඑස්, සෙ/328549 ලාකෝ සදරුවන් ඒඑස් යන පස්දෙනා තෝරා ගැනිම අප ඒකකය ලැබු කිර්තියකි.

මිත්‍ර ශක්ති යුධ අභ්‍යාසය සදහා ඉන්දියාවට යාමට ප්‍රථම විශේෂ පුහුණුවකින් පසු 2015.09.28 වන දින ඉන්දියාවේ පුනා නගරයේ දෙවන මහාර් රෙජිමේන්තුව වෙත ගොස් දින 14 ක් වැනි කෙටි කාල පරිච්ඡේදයක් තුල ඉන්දියන් හමුදාව සමග ඒකාබද්ධ පුහුණුවිම් සිදුකර එම අභ්‍යාසයෙහි විෂය නිර්දේශ 05 ක් යටතේ තෝරාගත් දක්ෂයින් 05 දෙනාගෙන් හොදම යුධ උපක්‍රම සදහා වු රන් පදක්කමින් සෙ/309330 බනි 1 ඒඒ අනුර කුමාර යන බළලත් නිලධාරි පිදුම් ලැබු අතර, හොදම ක්‍රිඩකයාට හිමි රන් පදක්කමින් සෙ/328549 ලාකෝ සදරුවන් ඒඑම්සි යන කොනොනි පිදුම් ලබන ලදි. මෙම රණවිරුවන් හට තව තවත් විශිෂ්ඨ ජයග්‍රහණ ලබා ගැනිමට අවශ්‍ය ශක්තිය ධෛර්ය ලැබේවායි ඒකකයේ අණදෙන නිලධාරිතුමා ඇතුළු සියළුම නිලධාරින් සහ සෙසු නිලයින් ප්‍රාර්ථනා කරන්නෙමු.

බුද්ධි නිලධාරී 19 ශ්‍රීලපාහ







## රෙජිමේන්තු නිලධාරි නිවස්නය නවීකරණය කර විවෘත කිරීම

## Regimental Officers Mess DECLARED OPEN

ශ්‍රී ලංකා පාබල හමුදාවේ රෙජිමේන්තු මධ්‍යස්ථානයේ නිලධාරි නිවස්නයට නව මුහුණුවරක් එක්කරමින් හිටපු යුද්ධ හුමදා පති හා රෙජිමේන්තු අධිපති ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්වී යුඑස්පී එන්ඩීයු පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන්ගෙ සංකල්පයක් මල්පල ගන්වමින් නවීකරණය වු නව නිලධාරි නිවස්නය, මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එම්එම් කිත්සිරි ආර්එස්පී ගේ ආරාධනයෙන් රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේවීඩීවී කරුණාසේකර ආර්එස්පී වීඑස්වී යුඑස්පී එන්ඩීයු පීඑස්සී ගේ සුරතින් 2015.10.23 දිනට යෙදුන සුභ මොහොතින් විවෘත විය.







සටහන
වයිට්හැකල් ප්‍රකාශන අංශය

ඡායාරූ : ලාකෝ පත්මසිරි යූඩීඑන්
(වයිට්හැකල් ඡායාරූප අංශය)

JOURNAL OF THE SRI LANKA LIGHT INFANTRY
The WHITE HACKLE 86 ISSUE OCT - DEC
වයිට් හැකල් | ශ්‍රී ලංකා පාබල හමුදා සඟරාව | இலங்கை காலாட் படை சஞ்சிகை



# අභයදානය දීමට හැකි වන්නේ මනුෂ්‍ය භවයේදී පමණි

උතුම්ම දානය වන ධර්මදානය සමග එකට අත්වැල් බැඳි අනෙක් දානය නම් ජීවිත දානයයි. මහා මෛත්‍රියෙන් මහා කරුණාවෙන්, මහා ශාන්තියෙන් කළ හැකි මහා උතුම්ම දානය වශයෙන් ඕනෑම අයකුට ලබාදිය හැක්කේ ජීවිත දානයයි. සියදිවි නසා ගන්නා මනුෂ්‍යයන් මිනිස් ලොව සුලබව ඇතත් සත්ව ලෝකයේ එසේ දිවි නසාගන්නා සත්වයන් ගැන අප අසා දැක නොමැත.

තිරිසන් අපාය හෙවත් තිරිසන් ලෝකයේ වසන සියලු නිරි සත්වයන් නිරතුරුව බියෙන් සහ සැකයෙන් දිවිගෙවති. ඒ ඔවුන් ගෙන ආ අකුසල කර්මයි. කවුරුන් විසින් හෝ තමන්ට හිරිහැර කරතියි යන බිය ඔවුන්ගේ සිත් සතන් තුළ උපතින්ම ලියැවී ඇත. එම නිසා දිවා රෑ ඔවුන් දිවි පෙවෙත් ගෙනයන්නේ අතිශය ශෝකබරිතවය. අපා, දෙපා, සිව්පා, බහුපා ආදී සියලු සත්වයින් කිසිදු වෙනසක් නොමැතිවම සියොළ වෙලාගිය බියකින්ම දවස ගතකරයි. එහෙත් මිනිසත් බව ලබා ඇති මිනිස් සත්වයාගේ ආදරය, කරුණාව රැකවරණය ලැබීමට වාසනාවන්තවූ ඇතැම් සත්වයන් ස්වභාවිකව මියයන තෙක් ජීවිත බියකින් කල් නොගෙවන බවද මෙහිලා පැවැසිය හැකිය.

මෙවැනි තත්ත්වයන් තුළ අපගේ නෙත් යොමුවන්නේ නිතර දෙවේලේ කුසගින්නෙන් පෙළෙන කපුටන් දෙසය. කිසිදු මිනිසකු හෝ සත්වයකු කපුටු මස් ආහාරයට නොගනී. එහෙත් ඔබ විමර්ශනය කරන්න කපුටන් කෙතරම් මර බියකින් නිරතුරු ජීවත්වනවාද කියා. ගොදුරු සොයන සත්වයන්ගෙන් සිය පැටවුන් බේරාගැනීමට සත්ව දෙමව්පියන් වෙහෙසෙන සැටි අප සමහරවිට දැක ඇත. එහෙත් එම උත්සාහයන් සාර්ථක වන්නේ කෙතරම් කලාතුරකින්ද? දුර්ලභව ලබාගත් මෙම වාසනාවන්ත මනුෂ්‍ය භවයේදී ඔබට පුළුවනි. එම අසරණ සත්වයිනට උන්ගේ දරුවන් රැකදීමට කටයුතු කිරීමට පුරුදුවන්න. මෙතැනදී අවශ්‍ය වන්නේ බුදුරදුන් දෙසා වදාළ එසේම ධම්ම පදයේද සඳහන්ව ඇති "සියලු සතුන් දඬුවමට මරණයට බිය ඇත්තාහ. තමන්ට වනවා යෑයි අනුරූපව සිතන්න යන" පාඨයයි.

එවන් වටිනා සම්බුදු මුවින් පිටවූ දේශන නිරතුරුවම සිත් සතන්හි දරාගන්න පුරුදුවන්න. එය කුඩා කල සිටම ඔබට ලැබෙන මහගු දායාදයකි. උතුම් කරණීය මෙත්ත සූත්‍රයේ විලසින්ම තිට්ඨං, චරං, නිසින්නෝවා, සයානෝවා යාවතස්ස විගත මිද්දෝ සිටගෙන සිටිමින් ඇවිදිමින්, හිඳගෙන සිටිමින් හෝ වැතිර සිටිමින් හෝ යහනෙහි නොනිදා සිටින තාක් කල් සියලූ සතුන් කෙරෙහි නිරතුරු මෛත්‍රීය වැඩීම නිවනට පවා යොමුවන බලවත් කුසල කර්මයකි.



මස් සඳහා මැරීමට සිටින ගවයින් හට අභය දානය

සියලූ සතුන් මරණයට බිය නම්, මරණයට ඔබත් බිය නම්, ඔබ කළයුත්තේ කිසිදු වර්ග භේදයකින් තොරව "දිට්ඨාවා යේව අද්දිට්ඨා" දකින නොදකින සියලූ සතුන්ට සැම

අනෙක් පිටුවට

# සිරගතව සිටින කුරුල්ලන් හට අභය දානය පිණිස නිදහස් කොට හැරීම



දිනකම ජීවිත දානය දීමට කටයුතු කිරීමයි. ඉතා සියුම් කුඩාම කෘමියන් පවා සම්බුදුරදුන් දෙසූ ජීවිත දානයට අදාළය. හදවත අවිහිංසාවෙන් මෛත්‍රියෙන් කරුණාවෙන් පිරී ඉතිරී යන්නේ එවිටය. එයම ඔබේ ඉදිරි ගමනට කුසලින් පිරී නොනවතින පහන් එළියකි. ඔබට නිරෝගීව, දීර්ඝායුෂ සහිත ජීවිතයක් ගත කිරීමට අල්පායුෂ දීර්ඝායුෂ කරගැනුමට ඇති ඒකායන මාර්ගයත් එයම පමණි.

සම්බුදුරදුන් ආවාට ගියාට සූත්‍ර දේශනා පැවැත්වූයේ නැත. එසේම පසුව විකෘති කර ඇති පරස්පර ධර්මයන් දෙසා වදාළේද නැත.

එවන්දෑ සිය බුද්ධියෙන් විමසා ගැනීම බුදුරදුන්ගේම ඒහි පස්සිකො ඕපනයිකො පච්චත්තං න්‍යායෙන්ම තේරුම් ගැනීම වටී. සම්බුදුරදුන් දෙසූයේ තම ධර්මය වුවත් තීක්ෂණ අයුරින් විමසා බැලීමටය. පසුකාලීනව යම් යම් අය කියන ලියන දෑ කාලාම සූත්‍රය අනුසාරයෙන් තේරුම් කර ගැනීමට උපදෙස් දුන්නේද මේ නිසාය.

සත්වයින් මියයන විට සිය අසරණකම නිසාම උන්ගේ සිත් සතන් තුළ ඇතිවන්නේ අතිභයංකර බද්ධවූ වෛරයකි. එසේම මරන්නා පසුපස ඇදී එන නොනිම් ශාපයකි.ඒ සඳහා අනුබල දෙන්නාටද ගැලවීමක් නැත. කරකියා ගැනීමට හෝ තමාට තමාව රැක ගැනීමට අපහසු මිනිස් හෝ තිරිසන් හෝ භේදයකින් තොරව ඇතිවන්නේ, සිත්වලින් පිටවන්නේ න්‍යෂ්ටික ආයුධවලටත් වඩා වැඩි බලවත් ශාපයකි. එකී ශාපවලින් ගැලවීමට කුමන තරාතිරමක අයකුට හෝ සංසාරයේදීම කිසිසේත්ම අපහසුය.

මෙතනදී අපට පෙන්වා දිය හැක්කේ ජීවිතදානය දීම නොමඳවම කළ හැක්කේ මෙම වාසනාවන්තව ලබාගත් මනුස්ස භවයේදී පමණක් බවය. සියලූ මනුෂ්‍යයින්ම එය දැනගත යුතුය. ජීවිත නැති කිරීම මිනිස් තිරිසන් භේදයකින් තොරව ඕනෑම පව්කාරයකුට පහසුවෙන් කළ හැකිය. එසේම එකී පව්කාරයන්ට තමන් නැසූ ජීවිත යළි ලබාදිය නොහැක. මෙයම සිද්ධාන්තයකට ගෙන හැකි අයුරින් සියලූ සතුන්ට ජීවිත දානය දෙන්න. පයට පෑගීමට යන කුඩා කුහුඹුවකුට හෝ ජීවිත දානය දෙන්න. එයයි සම්බුදුරදුන් ලොවට ගෙන හැර පෑ මහා කරුණාව. ඒ නිසයි අට පිරිකරේ එක් පිරිකරක් වශයෙන් පෙරහන්කඩය පවා නිර්නය කළේ. උන්වහන්සේද යන යන තැන එය රැගෙන වැඩියේ. මහණෙනි වතුර පෙරා බොන්න, එසේ කොට පෙරහන්කඩය නැවත වතුරේ ගසා නැවත ප්‍රයෝජනයට ගන්න.

දැන් සිතන්න, නොපෙනෙන සතුන්ට පවා එකල බුදුහිමියන් කෙතරම් සැලකිල්ලක් දැක්වූවාද කියා. එසේ දිරිගැන්වූ සම්බුදුරදුන් පෙනෙන සතුන් මරවා කෑමට අවසර ලබාදේවිද? එක ජීවියකුට අභය දානය දීම වනාහි ජීවමාන සම්බුදුවරයකුට පිදෙන සිව්පස දානයක මහා කුසලය හිමිවන බව, බුදුහිමියෝ දෙසා වදාළේ සියලූ කල බුදුවරු නොමැති නිසා. ජීවිත දානය දීම තමන් වහන්සේ ජීවතුන් අතර සිටින අවධියේදී ලබාදෙන සිව්පස චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස් දානයක් ලෙස සැලකීමටය. එහෙත් අවාසනාවක තරම මෙවැනි අගනා දෙසුම්, මිල කළ නොහැකි දෙසුම් අද අතුරුදන් වී ඇති සෙයකි.

ජීවිත දානය ලැබිය යුතු මෙලොව වැඩියෙන්ම වද වේදනා විඳිමින් තම බඩදරු පැටව් සමග හැලියේ තැම්බී මියයන කකුලූ අම්මලාව තම්බා තුනපහ රසකාරක, ලූණු, මිරිස්, සෝස් දමා ඇතැම් පන්සල් තුළම සකසා දානය වශයෙන් ලබාගන්නා පින්වන්තයන්ද අප දේශය තුළ සිටින බව ඇතැම් පුවත්පත් වල පවා දැක්වී ඇත.

පිංවත් සැදැහැවතුනි, මෙවන් අසරණ කකුළුවන් පණ පිටින් අතපය බැඳ මත්ස්‍ය වෙළඳපළවල විශේෂයෙන් වෙරළබඩ වෙළෙඳසල්වල විකිණීමට තබාඇත. ඒවා විකිණෙන්නේ කිලෝ ගණනටය. එවන් කකුළුවන්ගෙන් සියයට අසූපහක්ම බඩදරු අම්මලාය. හැකිනම් ඔබලා කිහිප දෙනකු එකතුවීමෙන් උන්ව මිලදී ගෙන ආරක්ෂිත කලපු ප්‍රදේශවලට බැමි කපා දමා නිදහස්කර යවන්න. එවන් ජීවිත දාන පිංකම් වල වටිනාකම ගැන ප්‍රකාශ කිරීමට අප ශබ්ද කෝෂවල වචන පවා නැත. ඔබට වැයවන්නේ සංසන්දනාත්මකව සුලූ මුදලකි. උපන් දිනවලදී මෙවැනි ජීවිත දාන ක්‍රියාවන්හි නිරතවන්න.

ආහාර දානය මිනිසුන් පමණක් නොව සතුන්ද කරනා ක්‍රියාවලියකි. සියලූම සතුන් පාහේ සිය දරු පැටවුනට ආහාර ලබාදෙන බව ඔබද දන්නා කරුණකි. එයද දානයකි. එමනිසා ආහාර දානය මිනිසුන්ට පමණක් නොව සතුන්ටද කළ හැකි එසේම කරන දෙයකි. අප මේ කියන්නක් අසනු මැනවි, ජීවිත දානය දිය හැක්කේ දෙවියන්ට හෝ බ්‍රහ්මයන්ට නොවේ. සතර අපාගතවී ඇති සත්වයින්ටද එය කළ නොහැකිය. එසේ නම් කළ හැක්කේ උතුම් මනුෂ්‍ය භවයක් ලැබ ඉපදී ඇති අපට පමණය. ඒ බව තේරුම් ගන්න. තෙරුවන් සරණයි!

අන්තර්ජාලය ඇසුරෙන් සැකසුම
ලාකෝ රත්නකුමාර ඩීකේඑන්එන්
වයිට්හැකල් ප්‍රකාශන අංශය



# NELSON MANDELA

Nelson Mandela believed that one day all the South African`s will sit together and live together. He risked his own life to set freedom for black South Africans. His anti-apartheid campaigning created the democratic South Africa. Because of this he becomes an international hero. As a personal friend of Nelson Mandela, Peter Hain has nicely capture the braveness, respectful, smart, tolerant, never gave up and never received the only gave of this great soul, in this biography.

'MANDELA' by Peter Hain tells the life and achievement of one of the twentieth century`s most inspiring figure with the black skin. Represent as a Lawyer, freedom fighter, a protester, anti-apartheid revolutionary, philanthropist and a political leader. Hain always tried to deliver a message to all politicians in the world about this influential statesman. This popular, interesting and extremely user-friendly book takes an in-depth look at South Africa`s first black chief executive and his struggle for freedom.

Before create 'MANDELA' Hain`s divided Mandela`s life into 3 stages. Like Mandela`s personal life and his arrive for the freedom fight, Development of his personality and Growth as a man and a leader. Hain begin his journey from the village of 'Mvezo' who was born there as Rolihlahia Mandela. For that Hain never forget to attach Mandela`s rural childhood. He spoke about Mandela`s education. Mandela attended the University of Fort Hare and the University of Witwatersrand where he studied law.

From Hain`s biography he mentioned those campaigns which were Mandela participated very interestingly. Living in Johannesburg, Mandela became involved in anti-colonial politics, joining the ANC and becoming a founding member of its Youth League. After the South African National Party came to power, he rose to prominence in ANC`s Defiance Campaign, was appointed superintendent of the organization`s Transvaal chapter and Presided over the Congress of the people. Working as a Lawyer, he was repeatedly arrested for seditious activities and, with the ANC leadership, was unsuccessfully prosecuted in the Treason Trail. Influenced by Marxism, he secretly joined the South African Communist Party and sat on its Central committee. Although initially committed to non-violent protest he co-founded the militant Umkhonto we Sizwe, leading Sabotage campaign against the apartheid government. In 1962, he was arrested, convicted to conspiracy to overthrow the state, and sentenced to life imprisonment in the Rivonia Trail. Mandela served over 27 years in prison initially on Robben Island. An international campaign lobbied for his release. Hain`s used his words very sorrowfully for Mandela`s prison life.

In Hain's book talked him as free man. This free man again joined to the politics. Mandela joined negotiations to abolish apartheid and establish multiracial elections, in which he led the ANC to victory and became South Africa`s 1st black president. He served as President of the African National Congress and Secretary General of the Non-Aligned Move. Mandela introduced measures to encourage land reform, combat poverty, and expand health care services. Hain`s he appreciated very much for the Mandela for his charitable work in combating poverty and HIV/AIDS through the Nelson Mandela Foundation.

For his great service having received more than 250 honors including the Nobel Peace Prize. As Hain write in, “Mandela`s story is an extraordinary one and an inspiration for humanity from barefoot herd boy to world leader; from freedom fighter to reversed statesman; from prisoner to president.”From Hain`s biography he successfully presented to readers, that words are much

**Lieutenant D L P Weligama SLLI**
**(19 SLLI)**

නිවැරදි විසදුම්පත් 2016 අප්‍රේල් මස 15 වන දිනට පෙර එවිය යුතුය. තරඟ කූපනය සහ කොන්දේසි මෙහි සඳහන් කර ඇත.

1. ප්‍රහේලිකාව පසුපස ඇති අයදුම්පත සම්පූර්ණ කර පහත ලිපිනයට තැපැල් කළ යුතුයි.
2. මෙම තරඟයට වයිට් හැකල් සඟරාවේ කාර්ය මණ්ඩලයට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් හට සහභාගි විය නොහැක.
3. පළමුවන, දෙවන හා තුන්වන ජයග්‍රහන හිමිකර ගන්නා ජයග්‍රාහකයින් පිළිවෙළින් රු. 1000/, රු.750/, රු.500/ වශයෙන් මුදලින් තෑගි ලබා දීමට තීරණය කර ඇත.
4. විනිශ්චය මණ්ඩලයේ තීරණ අවසාන තීරණය ලෙස සැලකේ.
5. නිවැරදි පිළිතුරුපත් කුසපත් ඇදීමෙන් තෝරා ගනු ලබන ජයග්‍රාහකයින් තිදෙනෙකු සඳහා පමණක් තෑගි දීම සිදු කෙරේ.
6. පිළිතුරුපත් එවන ලියුම් කවරයේ වම් පස

ලිපිනය : වයිට් හැකල් කර්තෘ,
වයිට් හැකල් ප්‍රකාශන අංශය,
රෙම ශ්‍රීලපාහ, යුද්ධ හමුදා ජනපදය,
පනාගොඩ, හෝමාගම.

## වයිට් හැකල් ප්‍රහේලිකාව අංක 64



### හරහට

1. පිළිමය
5. දසමහා යෝදයින්ගෙන් කෙනෙකි
10. බිම ඇමදීමට ගනී
12 මහනකම අත්හළ පුද්ගලයා
13. රජතුමා වාසය කරන ස්ථානය
14. ලැබුණි
15. මේවා දීමෙන් මිතුරුකම නැතිවේ
16. නිවස වටා ඇති බිම
18. බුදුන් වැඩි පින් බිමකි
20. ආදරය යන්නෙහි විරුද්ධ පදය
21. ගිහි දිවිය අත්හල අයෙක්
23. විරුද්ධවාදීන් අතර ඇතිවේ
26. අවුල් ජාලාවක් ලෙස ඇති තැනක් මෙසේ හැඳින්වේ
28. ගැටුම්වලට මුල් වන දෙයකි
30. .............. කොළ ගොඬේ හරක් යනවා වගේ
31. විශාල වෘක්ෂයකි
33. නපුරු
34. ජාතක කථාවකි
37. ජීවිත නැසීමට යොදාගනී
38. නඩුවලදී වැදගත් වන චරිතයකි
40. යමෙක සීමාව දැක්වීමට යොදාගන්නා දෙයකි
41. දඬුවම් දීමට යොදාගන්නා දෙයකි
42. ශීත රටවල දැකිය හැකි දෙයකි
43. පුරාණයේ භාවිත කළ මුදල් වර්ගයකි
44. ඇතුළත යන්නට විරුද්ධ පදය
45. ජල මාර්ග හරහා බැද ඇති බැම්
47. ජයග්‍රහණය සඳහා මේවා වැඩිපුර ගත යුතුය
48. නගරය නොවේ
50. හදිසියෙන්
52. දැව වර්ගයකි
54. විශාල
55. නරක ගති ඇති පුද්ගලයා
56. ආසියාතික රටකි
57. යුද්ධයෙන් රටවල් ජයගැනීම
58. අලුත්

### පහලට

1. "නැති" යන අරුත ඇත
2. වේදිකාවක ඉදිරියෙන් ඇත
3. ජලයේ වෙසෙන සත්ව විශේෂයකි
4. ගැටළු ඇති කරමින් ඒවායින් ප්‍රයෝජන ගැනීම සාමාන්‍ය ව්‍යවහාරයේ මෙසේ හැඳින්වේ
5. මෙය දෙව්ලොව ඇතැයි කියති
6. නිරිඳා
7. ගෙය
8. මාසය
9. කාන්තාව
10. නපුරු වන සතෙකි
11. ඉතා දීප්තිමත්
17 සපත්තු මල්
19 මිනිරන් හාරනවා, මැණික්..........
20 දෙව් කෙනෙකි
22. තිත්ත බෙහෙතකි
24. ලා දළුව
25. වාහනය පදවන්නා
27 ගැටගැසීමට අවශ්‍ය වේ
28. මුක්කු
29. මෙය නොහඳුනන මව්පියන් පවා අද සමාජයේ දැකිය හැක
30. ලංකාවේ සිටි සිනමා නිළියකි
32. මොරටුවේදී හමුවෙනවාලු
35. පාරා වළල්ල
36. කඳුපන්තියකි
39. ආබාධිත සෙබළුන් හට නැතිවම බැරි දෙයකි
45. පඩිය
46 බටහිර අප්‍රිකාවේ රටකි
49. මල්සරා
51. පාවෙන වළාකුළු............ සුලඟ
53. පාද දෙකක් ඇති
54. කරදර

## වයිට් හැකල් ප්‍රහේලිකාව අංක 64

### කූපනය

අංකය:

නිලය:

නම:

රාජකාරි ලිපිනය :

ඒකකය :

ජාතික හැදුනුම්පත් අංකය :

### වයිට්හැකල් ප්‍රහේලිකා අංක 63

ජයග්‍රාහකයින් බිහිවී නොමැත

## දැන්වීමයි

පාබල හමුදා සිල්ව බියුගල් සංගීත කණ්ඩායම වෙත ඉංග්‍රීසි, හින්දු, දෙමළ හා වෙනත් භාෂා වලින් ගීත ගායන හැකියාව ඇති අයවලුන් බඳවා ගැනීමේ පුරප්පාඩු ඇත. මේ සඳහා වයස අවු: 18 - 24 ත් අතර අයදුම් කළ හැක.

වැඩි විස්තර සඳහා

තුවාක අංශ භාර නිලධාරී

077 8281632

## වයිට් හැකල් අංශය මගින් ප්‍රකාශනය කරනු ලබන

සියලුම වයිට්හැකල් සඟරා අප අංශය මගින් පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් නැරඹීමට හෝ එමගින් බාගතකරගෙන ඔබගේ Smart Phone/Tab/Laptop ආදියෙන් නැරඹීමේ පහසුකම් සලසා ඇත. ඒ සඳහා මෙහි සඳහන් කර ඇති වෙබ් අඩවිය වෙත පිවිසෙන්න..

http://www.army.lk/lightinfantry






# පාබල විරුවන් වෙනුවෙන් ඉදිවූ රණවිරු ස්මාරකය

ශ්‍රී ලංකා පාබල රෙජිමේන්තු මධ්‍යස්ථානයට වසර 20ක් සපුරාලීම නිමිති කොටගෙන 2009.10.23 දින එවකට රෙජිමේන්තු අධිපති, යුධ හමුදා මාණ්ඩලික ප්‍රධානි හා හිටපු යුද්ධ හමුදාධිපති ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්වී යුඑස්පී එන්ඩීයු පීඑස්සී සංකල්පයකට අනුව හිටපු පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්පී ආර්එස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන්ගේ අධීක්‍ෂණය යටතේ ජනාධිපති ලේඛම් ලලිත් වීරතුංග මැතිතුමන්ගේ සුරතින් මියගිය පාබල රණවිරුවන් සිහිකිරීම සඳහා ඉදිකිරීමට නියමිත රණවිරු ස්මාරකයට මුල්ගල තබන ලදි.

මෙම ස්මාරකයේ වැඩ කටයුතු ආරම්භයේ දී වැඩ කණ්ඩායම් භාර නිලධාරි ලෙස මේජර් සීඩී රඹුක්කන ආර්එස්පී ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ අධීක්‍ෂණය යටතේ ඉදිකිරීම් කටයුතු සිදුකල අතර, ඉන්පසු ලුතිතන් කර්නල් කේපීඑල් අමුණුපුර ආර්ඩබ්පී ආර්එස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් විසින් ස්මාරකයේ වැඩ කටයුතු අධීක්‍ෂණය කරන ලද අතර, එහි ප්‍රගතිය වෙනුවෙන් සුවිශේෂී දායකත්වයක් ලබා දී ඇත.

මෙහිදි රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක වරුන් ලෙස බ්‍රිගේඩියර් කේජේ ජයවීර ආර්ඩබ්පී ආර්එස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරි හා බ්‍රිගේඩියර් සීඩී විරසූරිය ආර්එස්පී යන ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් ඉදිකිරීම් ප්‍රගතිය සොයාබලමින් විශාල දායකත්වයක් ලබා දි ඇති බව ගෞරවයෙන් සටහන් කරන්නෙමු.

තවද මෙම රණවිරු ස්මාරකයේ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් 90% ක් මෙම රෙජිමේන්තු භට පිරිස් විසින් ශ්‍රමදායකත්වය ලබා දෙන ලදි. එහිදි ස්මාරකය වෙනුවෙන් විශාල දායකත්වයක් ලබාදෙමින් සිටියදි රිය අනතුරකට ලක්ව මියගිය කෝප්‍රල් ධම්මික එච්ඩීඑල් රණවිරුවාට පාබල හමුදාවේ සියලුම නිලයින්ගේ හදපිරි ශෝකය පුදකරමින් නිවන් සුව ප්‍රාර්තනා කරමු. ස්මාරකයේ මූලික සැලසුම සකස් කරමින් එහි අධීක්‍ෂණ කටයුතු සිදු කළ සිවිල් ඉංජිනේරු ජයම්පති හේරත් මහතා අප විශේෂයෙන් සිහිපත් කලයුතු අතර, මෙම ස්මාරකය ඉදිකිරීම සඳහා නන් අයුරින් සහයෝගය ලබාදුන් සියලු දෙනාට රෙජිමේන්තු අධිපති තුමා ඇතුලු සියලු නිලයන් විසින් හදපිරි ස්තුතිය පුද කර සිටින්නෙමු









# අභිමන් මුදුනත

හිටපු යුද්ධ හමුදාධිපති සහ රෙජිමේන්තු අධිපති ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී එන්ඩීයූ පීඑස්සී තුමන්ගේ සංකල්පයක් මත වැඩ ඇරඹි මෙම රණවිරු ස්මාරකය 2009.10.23 දින ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මැතිතුමන් අතින් මුල්ගල තබන ලදී. පසුව 2015.10.26 දින රෙජිමේන්තු වර්ණ ප්‍රදානෝත්සවයට සමගාමීව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති සන්නද්ධ හමුදාවන්හි සේනාධිනායක මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන් සුරතින් විවෘත විය.

